2024 දෙවන කලාපය

# දූතයා

ආත්මික සඟරාව | 64 වන කාණ්ඩය



ක්‍රිස්තියානි රෙපරමාදු සභාව මගින් ප්‍රකාශිත සඟරාවකි

# පටුන


| | | |
|---|---|---|
| 01 | කතු වැකිය | පිටු අංක 03 |
| 02 | ක්‍රිස්තුස් වහන්සේගේ ස්වර්ගාරෝහණය | පිටු අංක 04-05 |
| 03 | සැබෑ සතුට | පිටු අංක 06-07 |
| 04 | ආත්මික සඵලත්වය | පිටු අංක 08,13,14 |
| 05 | තරුණ පිටුව | පිටු අංක 09-12 |
| 06 | ළමා පිටුව | පිටු අංක 10-11 |
| 07 | කිතුණු ඇදහිලි ප්‍රකාශණ | පිටු අංක 15-18 |
| 08 | සභා පුවත් | පිටු අංක 12,19 |


# දූතයා


සංස්කාරක

ගෞරවනීය .එස්.ඊ.ජේබර් දේවගැති තුමා

පරිඝණක යතුරුලියනය, කවරය හා පිටුසැකසුම

රජිත විජයසිංහ

ප්‍රකාශනය

ක්‍රිස්තියානි රෙපරමාදු සභාව,

අංක 363, ගාලු පාර, කොළඹ 06.


- නොමිලේ ඉගැන්වෙන තැපැල් මාර්ගික බයිබල් පාඨමාලාව හැදෑරීමට, පොත් සහ සඟරා ලබා ගැනීම සඳහා විමසන්න,
සුභ අස්න අංක 363, ගාලු පාර,
කොළඹ 06.

0112360861

- ඔබගේ නිර්මාණ, ලිපි,කවි,රචනා හා සාක්ෂි දූතයා සඟරාවේ පළ කිරීමට කැමතිනම් අප වෙත යොමු කරන්න.

076 9145697

077 9610353

subaasnacrcoffice@gmail.com

# බුද්ධිමත්තු දැනගනිත්වා....

ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි රෙපරමාදු සභාවේ නිලමය සිංහල පුවත්පත වන දූතයා සඟරාව මෙවර කලාපය මගින් අපි ඔබට ආශිර්වාද පතමු.රෙපරමාදු සභාව ශ්‍රී ලාංකේය භූමියෙහි ස්ථාපනය වෙමින් මෙවර වසර (383) ක් සැමරමට සූදානම් වී සිටියි.

දේවානුභාවයෙන් ලද දෙවි සමිඳුන්ගේ වචනය ඉතා විශ්වාසවන්තව ප්‍රකාශ කරමින් දේව ජනතාව ගොඩනැගීම අපගේ මූලික වගකීම වේ. තවද දේව වචනය නිසි ලෙස අවබෝධ කර නොගත් ජනතාව හා සියල්ලන් වෙතට දහම් යාත්‍රාව දියත් කිරීම දේව ආඥාව බවද අප අමතක නොකළ යුතුය. ජනතාව නොමග යවමින් සමහර ආයතන හා සභාවන් කටයුතු කරගෙන යන බව පෙනේ. හොසියා දිවැසේවරයා විසින් ක්‍රි.පූ 721 දී වරදකාරකම සෙනඟට වටහා දෙන පිණිස තම ප්‍රවාචක සේවය කරගෙන ගියේය. එතුමා සමිඳාණන් වහන්සේගේ මාර්ගය හා පව්කරුවන් හට මුහුණ දීමට සිදුවන කණගාටුදායක ඉරණම සම්බන්ධව කතා කළේය.

**"සමිඳුන්ගේ මාර්ගය සෘජුය ධර්මිෂ්ඨයෝ ඒ මාර්ගයෙහි ගමන් කරති. එහෙත් පව්කාරයෝ එහි පැකිල වැටෙති."**

හොසියා ( 14:9)

සමිඳුන්ගේ මාර්ගය සෘජු බව පළමුව අප මතක තබා ගත යුතුය. "මාර්ගයද සත්‍යයද ජීවනයද මම බව" යේසුස් වහන්සේ ප්‍රකාශ කළ සේක.
(යොහාන් 14:6)

තවද මා මගින් මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙත නොපැමිණෙන්නේය. ඔබ මා හඳුනාගත්තහු නම් මාගේ පියාණන් වහන්සේ හඳුනාගන්නහුය යනුවෙන් තවදුරටත් උන්වහන්සේ ප්‍රකාශ කළ සේක.

එම සෘජු මාර්ගය වෙත ඔබද පැමිණ දෙවි සමිඳුන් හඳුනා ගන්න. තවද ධර්මිෂ්ඨයන් ඒ මාර්ගයෙහි ගමන් කරති. එහෙත් බොහෝ සෙනඟ මාර්ගය හඳුනා නොගෙන ව්‍යාජ මාර්ගවල ගමන් කරයි. යේසුස් වහන්සේ තුළ ධර්මිෂ්ඨ භාවය ලබාගත් සෙනඟ ඒ මාර්ගයෙහි ගමන් කෙරෙති. ඔබ ගමන් කරන මාර්ගය ඔබගේ විමර්ශනයට යොමු කරන්න. නිවැරදි මාර්ගය තෝරා ගන්න.

"එහෙත් පව් කාරයෝ එහි පැකිල වැටෙති" යනුවෙන් හොෂියා දිවැසිවරයා අනතුරු හඟවා තිබේ.

මෙම ප්‍රකාශනය වර්තමානයටද කදිම ලෙස ගැලපෙයි. තවද මෙහි ලියා ඇති දේ "ප්‍රඥාවන්තයෝ තේරුම් ගනිත්වා බුද්ධිමත්ව දැන ගනිත්වායි" තවදුරටත් එම දිවැස්වරයා මෙම අවවාදාත්මක පණිවිඩයෙහි ඇති වැදගත්කම හා ගැඹුරු භාවය අපට මතක් කර දෙයි.

නිවැරදි මාර්ගය වෙත ඔබ යොමු කිරීම අපගේ යුතුකම හා වගකීමයි. ඔබට දෙවි සමිදානන් ඒ සඳහා උපකාර කර තීරණයක් ගැනීමට උපකාර කරන සේක්වා.

*"යුක්තිය ගලා බසින දිය දහරක් මෙන්ද ධර්මිෂ්ඨකම නොසිඳී ගලන ගඟක් මෙන් ද පවතීවා."*

*(ආමොස් 5:24)*



එෆ්.ඊ. ෆේබර් දේවගැති තුමා
(සංස්කාරක දූතයා සඟරාව)

(2024 ජනවාරි මාර්තු කලාපය නිකුත් නොවූ බව සලකන්න.)



Untitled-1.indd 3 7/26/2024 12:11:14 PM



# ක්‍රිස්තුන් වහන්සේගේ ස්වාර්ගාරෝහණය හා සිංහාසනාරූඪවීමෙහි අරුත

ප්‍රතිසංස්කරණයෙන් පසු,කිතුනු සභා ලිතෙහි වටිනාම ශුද්ධ දවස් වන්නේ පාස්කුව හෙවත් ක්‍රිස්තුන් වහන්සේගේ මරණින් උත්ථානය වීම ය. ඒ හෙයින් ක්‍රිස්තුස් වහන්සේගේ දුක්කප්‍රාප්තියත්, එහි මුඛ්‍ය අරමුණ වන ක්‍රිස්තුන් වහන්සේ විසින් මනුෂ්‍යයන්ගේ පාප සඳහා වූ මිළය ගෙවා දැමීමත් සනිටුහන් කරන්නේ ය. දුක්කප්‍රාප්තිය තුළ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ විසින් මුලු ලෝකයේ පාපය ගෙවා දැමූ බවට සහතිකය ක්‍රිස්තුන් වහන්සේගේ මළවුන්ගෙන් උත්ථාන වීම මගින් ප්‍රකට කරන්නේ ය. මරණයට උන් වහන්සේ අල්ලාගෙන යටත් කළ නොහැකිවූ හෙයින් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මරණය පරාජය කොට මහිමාන්විත ශරීරයකින් පුනරුජ්ජීවනයට පැමිණි සේක.

**"....ඔබ අදමිටු මිනිසුන් ලවා උන් වහන්සේ කුරුසියේ ඇණ ගස්වා මරා දැමුවහු ය. එහෙත් දෙවියන් වහන්සේ මරණ බන්ධනයෙන් උන් වහන්සේ මුදා උත්ථාන කර වදාළ සේක. මන්ද, මරණයට උන් වහන්සේ බැඳ තබාගත නොහැකි විය."** (ක්‍රියා 2:23-24).

කිතුනු අපගේ විජයග්‍රාහි බලාපොරොත්තු ඇත්තේ එකී සිදුවීම තුළෙහි ය. එසේ නම් "ස්වර්ගාරෝහනය හා අසුන් ගැනීම" යන සන්සිද්ධිය මගින් අපට කියා දෙන්නේ කවරාකාර සත්‍යතාවයක් ද? පුරාතණයේ පටන් ම, ස්වර්ගාරෝහනය හා අසුන් ගැනීම වනාහි සමූහික ඇදහිලි උච්ඡාරණයේ මූලික ස්ථානයක් ගෙන ඇති බව අපොස්තලික හෝ නයිසීන ඇදහිලි ප්‍රකාශයන් දෙස අවධානය යොමු කිරීමේ දී පෙනේ. නිදර්ශනයක් ලෙස අපොස්තලික ඇදහිලි ප්‍රකාශයේ ජේසුස් වහන්සේ පිළිබඳ කොටස මෙසේ යඃ "උන් වහන්සේ ගේ පුත්‍ර වූ, අපේ ස්වාමි වූ යේසුස් වහන්සේ අදහමි. උන් වහන්සේ ශුද්ධාත්මයාණන් ගෙන් පිළිසිඳ; මරියා නම් කන්‍යවගෙන්  ඉපිද, පොන්තියුස් පිලාත් යටතේ වධ විඳ, මැරී තැම්පත් කරන ලැබ, ආත්ම නිවාසයට බැස, තුන්වන දින මළවුන්ගෙන් නැඟිට, ස්වර්ගයට නැඟී, සියලු බල ඇති පිය වූ දෙවියන් වහන්සේ ගේ දකුණු භාගයේ වැඩහිඳින බව ද, අදහමි".කිතුනුවන් හට මනුෂ්‍යයකු ලෙස ජේසුස් වහන්සේගේ පළමු පැමිණීම පිළිබඳවත් උන් වහන්සේගේ දෙවන පැමිණීම පිළිබඳ යම් අදහසක් ඇත්තේ ය.ඒ හෙයින් ජේසුස් වහන්සේ ස්වර්ගයට ඔසවා ගනු ලැබීම හෙවත් ස්වර්ගාරෝහනයේ ඇති වැදගත් කම පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් ය.

ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණය පිළිබඳ ඉගි ශුභාරංචිපොත් සතරේ මෙන්ම ක්‍රියා පොතෙහි ද සඳහන් වෙයි (ලූක් (24:50-5((1));) ක්‍රියා ((1)9-11).) විශේෂයෙන් ම ලූක්තුමා විසින් ක්‍රිස්තුන් වහන්සේගේ මළවුන්ගෙන් උත්ථාන වීම හා ස්වර්ගය වෙත නැගීම හෙවත් " **උසස් කරනු ලැබීම**" මානව විමුක්තියේ විශේෂ අංගයක් ලෙස ප්‍රකාශ කරනු ලබන්නේ ය. ක්‍රිස්තුන් වහන්සේ පියාණන් වහන්සේගේ දකුණු භාගයේ සිට පාප කමාව දානය කරන සේකඃ "එම තැනැන් වහන්සේ නායකයාණන් ද ගැළවුම් කාරයාණන් ද වන පිණිස දෙවියන් වහන්සේ සිය දකුණතින් දකුණතට උසස් කර වදාළ සේක. එසේ කෙළේ, ඉශ්රායෙල්ට පසුතැවී සිත් හරවා ගැනීමත් පව් කමාවත් දෙන පිණිස ය"

(ක්‍රියා (5:31).)

ක්‍රිස්තුන් වහන්සේගේ ජීවමාන බව හා පොළොවේහි උන් දැන් වහන්සේ වැඩ නොසිටිමේ යථාර්ථය පැහැදිළි කිරීම පිණිස ස්වර්ගාරෝහනය වැදගත් වන්නේ ය. අපි නොදුටු ස්වාමින් වහන්සේ හට ප්‍රේමය හා නමස්කාරය දක්වමු. පේදුරු තුමා මෙසේ පවසයි:

"**ඔබ උන් වහන්සේ නුදුටු නමුත්** උන් වහන්සේට ප්‍රේම කරන්නහු ය. දැන් ඔබ උන් වහන්සේ නොදකින නමුත්, උන් වහන්සේ අදහා, ඔබගේ ඇදහිල්ලේ අරමුණ වන ඔබගේ ආත්ම ගැළවීම ලබමින්, කියා නිම කළ නොහැකි, තේජාන්විත මහා ප්‍රීතියකින් ප්‍රීතිවන්නහු ය"

(1 පේදුරු 1:8-9).

**දෙවනුව,** ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ගාරෝහනයේ අභිමතය වන්නේ පියාණන් වහන්සේගේ දකුණුභාගයේ අසුන් ගැනීම ය. එක් අතකට, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දෙවියන්



Untitled-1.indd 4 7/26/2024 12:11:14 PM

වහන්සේගේ පුත්‍රයාණන් ලෙස පොළොවෙහි මනුෂ්‍යකු වශයෙන් මාංශමත් වන්නට පළමුවෙන් වූ උන්වහන්ගේ මුල් තත්ත්වයට පැමිණි සේක (ජොහන් (1:1, 8;) (13:1;) (17:5,) (11,) (13,) (23).) ක්‍රිස්තුන් වහන්සේ සියල්ලෙන් විජයග්‍රහනය ප්‍රකාශ කිරීම මෙලෙසින් ප්‍රකට කළ සේක. ජේසුස් වහන්සේ

**"ජීවමාන තැනැත්තා ය. මම මැරුණෙමි; එහෙත් බලන්න, මම සදහට ම ජීවත් ව සිටිමි. මරණයේ ද පාතාල ලෝකයේ ද යතුරු මට ඇත" කී සේක**

(එළිදරව් (1:18).)

දේව පුත්‍රයාණන් උන් වහන්සේ මුල් ස්වභාවයට පත් වීමවත්, පූර්ව ජම්මික ව වැඩ සිටි ස්ථානයට නැවත හැරී යාම පමණක් මෙයින් අදහස් නොකෙරේ. ස්වර්ගාරෝහනයෙන් පූර්වයේ පටන් ප්‍රකාශ වූ ආකාරයට මෙසායා දෙවියන් වහන්සේගේ දකුණු පස සිංහාසනාරූඪ වීම සිඳු විය (ගිතාවලිය (110:1;) ක්‍රියා (2:33-34;) එපිස (1:20;) 1 පේදුරු (3:22).) ජේසුස් වහන්සේගේ සිංහාරූඪ වීම පිළිබඳ මෙසේ පවසන සේක:

**"මා ජයගෙන, පියාණන් වහන්සේ සමඟ, උන් වහන්සේගේ සිංහාසනයෙහි හිඳගත්තාක් මෙන්, ජයග්‍රාහකයාට ද මාගේ සිංහාසනයෙහි මා සමඟ හිඳගැන්මට දෙන්නෙමි"**

(එළිදරව් (3:21).)

**තෙවනුව**, ජේසුස් වහන්සේගේ සිංහාසනාරූඪ විම අඛණ්ඩ ලෙස ලෝකය වෙනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ මැදිහත්කාරත්වය දැරීමේ උත්තම පූජකත්වය පවත්වාගෙන යන සේක. ජේසුස් ක්‍රිස්තුන් වහ්සේගේ පූජකත්වය සපත කරන්නේ, "නුඹ මෙල්කිසදෙක්ගේ පරපුරෙන් සදහට ම පූජකයෙක් ය'යි සමිඳාණෝ දිවුළ සේක; එය වෙනස් නොකරන සේක." (ගිතාවලිය (110:4;) හෙබ්‍රෙව් (9:24).) ක්‍රිස්තුන් වහන්සේගේ විමුක්ති-සාදන සැලැස්ම තුළ ක්‍රිස්තුන් වහන්සේගේ සදාතනික පූජකත්වය අතිශයිම අවැසි ය. ක්‍රිස්තුන් වහන්සේ උන්වහන්සේ හට භාරදුන් මිහිමත සේවය ඉටු කළ පසු, මැදිහත්කාරකමෙහි ස්වර්ගීක සේවයට ඇතුල් වූ සේක. හෙබ්‍රෙව් කතුවරයා මෙසේ දක්වයි:

**"තවද, මරණය හේතුකොටගෙන පූජක පදවියෙහි පවතින්නට පූජකවරුන්ට නොහැකි වූ බැවින් පූජක සංඛ්‍යාව, විශාල විය. එහෙත් ජේසුස් වහන්සේ සදහට ම පවතින හෙයින් උන් වහන්සේගේ පූජක ධූරය අන් කෙනෙකුට පැවරිය නොහැකි ය"**

(හෙබ්‍රෙව් (7:23-24).)

එනයින් දෙවිඳුන් සමඟ ඇති ගණුදෙණුව, නිශ්චලය යː

**"එබැවින් අහස් මඬල ඉක්මවා ගිය දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසුස් නම් ශ්‍රේෂ්ඨ උත්තම පූජකයෙකු අපට සිටින නිසා, අපේ ඇදහිල්ලෙහි නොසෙල්වී පවතිමු."**

(හෙබ්‍රෙව් 4:14).

**සිව්වනුව**, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ස්වර්ගාරෝහනය මගින් වෙනත් සැනසිලිකාරයාණන් හෙවත් ශුද්ධාත්මයාණන් වහන්සේ අප වෙතට වැඩිය සේක.

**"කෙසේ වෙතත් මම ඔබ හට සැබෑව පවසමි. මාගේ නික්ම යාම ඔබේ ශුභසිද්ධිය පිණිස ය. මා නික්ම නොගියොත් සහායදායකයාණන් වහන්සේ ඔබ වෙත වැඩම නොකරන සේක. එහෙත් මම යන්නෙමි නම්, උන් වහන්සේ ඔබ වෙත එවන්නෙමි"**

(ජොහන් 16:7.)

**ස්වර්ගාරෝහනය සිඳු නොවූ යේ නම් ශුද්ධාත්මයාණන් වහන්සේගේ පැමිණීම සිඳු නොවනු ඇත.**

**"උන් වහන්සේ දෙවියන් වහන්සේගේ දකුණතින් උසස් කරනු ලැබ, පියාණන් වහන්සේ පොරොන්දු වූ ශුද්ධාත්මයාණන් ලබා, ඔබ අසන දකින මේ දේ ප්‍රදානය කළ සේක"**

(ක්‍රියා (2:33).)

අනුගාමිකයන් හට ශුද්ධාත්මයාණන් වහන්සේගේ පැමිණ ඔවුන් මත වැඩවසන තුරු ජෙරුසලමෙහි නැවති සිටින ලෙසින් ජේසුස් වහන්සේ අණ කළ සේක (ලූක් (24:29;) ජොහන් (7:39)

ශුද්ධාත්මයාණන් වහන්සේගේ මෙහෙයේ නව යුගයක් ඒ සමඟින් ආරම්භ විණ (රෝම (8:9-10;) 2 කොර (3:17;) ගලාති (4:6).) එනයින් අපි කුරුස පත් කළ ජේසු තුමන් දෙවියන් වහන්සේ විසින් ස්වාමින් වහන්සේ හා ක්‍රිස්තුන් වහන්සේ බවට පත් කළ බැව් ප්‍රකාශ කරමු (ක්‍රියා (2:36;) (7:55-56).)

**පස්වනුව**, ක්‍රිස්තුන් වහන්සේගේ ස්වර්ගාරෝහනය අවසාන සිඳුවීම නොවේ. ස්වර්ගාරෝහනය සමඟින් ක්‍රිස්තුන් වහන්සේ විජයග්‍රාහි ලෙසින් නැවත පැමිණීම පිළිබඳ ඉඟියක් දේවදූතයන් දෙදෙනෙක් පවසති. ලූක් තුමා වාර්තා කළ පරිද්දෙන්,

**"උන් වහන්සේ යන කල, ඔවුන් අහස දෙස බලාගෙන සිටිය දී, සුදුවතින් සැරසුණු මනුෂ්‍යයෝ දෙදෙනෙක් ඔවුන් ළඟ සිට, 'ගලීලයේ වැසියෙනි, ඔබ අහස දෙස බලාගෙන සිටින්නේ කුමට ද? ඔබ කෙරෙන් ඔසවාගනු ලැබූ මෙම ජේසුස් වහන්සේ ස්වර්ගයට නඟිනු දුටු සේ ම, ආපසු වඩිනු ඇතැ'යි කී හ"**

(ක්‍රියා (1:10-11).)

කල්වාරි කඳු මුදුනෙහි ක්‍රිස්තුන් වහන්සේ පාපසෝදන පූජාව කළ සේම, යක්ෂයාගේ බලය හා මරණය ද පැරද වූ සේක. ක්‍රිස්තුන් වහන්සේ විජයග්‍රහි ලෙස නැවත මිහිමතට පැමිණීම සමඟ උන්වහන්සේ කුරුස ගසේ කළ මෙහෙවර පරිපූර්ණත්වය පැමිණෙන්නේ ය.

එවිට සියලු ම මනුෂ්‍ය අකීකරුකම නිසා හට ගත් ප්‍රතිවිපාක ප්‍රතිස්ථාපනය වී, දේව රාජ්‍යය මිහිමත යථාර්ථයක් බවට පත් වන්නේ ය (පිලිප්පි (3:20;) ක්‍රියා ((3:21;)) 1 තෙසලොනික (4:16).

ඒසඳහාඅපටමහිමාවන්තබලාපොරොත්තුවක්ස්වාර්ගාරෝහනය හා පියාණන් වහන්සේගේ දකුණු පාර්ෂවයේ සිංහාසනරූඪ වීම සමඟ අපට ලැබෙන්නේ ය. යුගාන්තයේ දී සියලු කැරළිකාරකම් හා දුෂ්ඨත්වයන් පරදා ක්‍රිස්තුන් වහන්සේ සදාතනයට ම රජකම් කරන සේක (ගීතාවලිය (110:1,) (5-6;) එලිදරව් 3:21; රෝම (8:21).


රවින් කල්දේරා දේව ගැති තුමා

(ප්‍රෙස්බිටේරියන් සභාවේ දේවගැතිවරයෙකු වන මෙතුමා කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පීඨාධිපති ලෙස ක්‍රියාකරයි.

**එතුමාගේ දායකත්වයට ස්තූතියි.)**


*මරණයට උන් වහන්සේ අල්ලාගෙන යටත් කළ නොහැකිවූ හෙයින් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මරණය......*



Untitled-1.indd 5 7/26/2024 12:11:14 PM



# සැබෑ සතුට

> ''කෙසේ වෙතත්, කිතුනු ජීවිතය හැඟීම් වලට වඩා ඇදහිල්ල මත පදනම්ව ජීවත් විය යුතුය.''

මහාචාර්ය පී.වී.පී. සෝමරත්න

**සතුට** යනු අපි කවුරුත් කැමති තෘප්තියේ සිට දැඩි ප්‍රීතිය දක්වා විහිදෙන ධනාත්මක සහ ප්‍රසන්න භාවාත්මක මනෝ-පිබිදීමකි. සතුටේ අවස්ථා සුබවාදී ජීවිත අත්දැකීම් හෝ සිතුවිලි මගින් අවුලුවන්නේය. එහෙත් සමහර අවස්ථාවල එය මතුපිටින් පැහැදිලි හේතුවක් නොමැතිව වුවද මතු විය හැකිය . දිගු කාලයක් සඳහා සතුටේ මට්ටම ඇති ජීවිතයේ තෘප්තිමත් ලක්ෂණ, චිත්තයේ යහපැවැත්ම, සමෘද්ධිමත් සහ ආත්මයේ යහපත් තත්වයක පත් වීමත් සමඟ වඩාත් දැඩි ලෙස චිත්ත ප්‍රමෝදයක් ඇති වේ. සාමාන්‍ය ව්‍යවහාරයේදී, උදාහරණයක් ලෙස, ජීවිතයේ අර්ථය සොයා ගැනීමේදී මෙන් "ජීවිතයේ සතුට සොයා ගන්න" දැක්විය හැකිය . ඕනෑම චිත්තවේගයක් මෙන්, සතුට පිළිබඳ නිශ්චිත නිර්වචනය කිරීම දුෂ්කරය..

ක්‍රිස්තියානීන් නිරන්තරයෙන් සතුටින් සිටිය යුතු බව බයිබලය පැහැදිලිවම දක්වා ඇත. ජේසුස් වහන්සේ වරක් වදාළේ **"අශුද්ධාත්මයන් ඔබට යටත් වන නිසා සන්තෝෂ නොවන්න; ඔබගේ නාම ස්වර්ගයෙහි ලියා ඇති නිසා සන්තෝෂ වන්න''** කියාය.

සන්තෝෂය, අපි පොදුවේ තේරුම් ගන්නා පරිදි, බොහෝ විට අපගේ මානව හැඟීම් සහ හැඟීම් සමඟ බැඳී ඇත. කෙසේ වෙතත්, **කිතුනු ජීවිතය හැඟීම් වලට වඩා ඇදහිල්ල මත පදනම් වී ජීවත් විය යුතුය.** උනවහන්සේ කන්ද උඩ දේශනාවේදි උන් වහන්සේ අදහග න්නා භාග්‍යවන්ත බව පැහැදිලි වශයෙන් පෙන්වා සිටි සේක.

ගීතාවලිය 146:5 පවසන්නේ, **"යාකොබ්ගේ දෙවියන්වහන්සේගේ උපකාරය ඇති, තම දෙවිවූ ස්වාමීන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තුව තබා සිටින තැනැත්තා සන්තෝෂවත්ය."** මෙහිදී සතුට සම්බන්ධ වන්නේ බාහිර තත්වයන් නොසලකා දෙවියන් වහන්සේ කෙරෙහි බලාපොරොත්තු තබා ගැනීමයි.

හිතෝපදේශ 16:20 සන්තෝෂයේ උල්පතක් ලෙස ස්වාමින් වහන්සේ කෙරෙහි විශ්වාසය ද අවධාරණය කරයි: "වචනය නුවණින් පිළිපදින්නා යහපත සොයා ගනීව්, ස්වාමින් වහන්සේ කෙරෙහි විශ්වාස කරන තැනැත්තා සන්තෝෂවත්ය."

ස්වාමින්වහන්සේගේ ප්‍රීතිය යනු බයිබලානුකූල සඳහනකි, එයින් අදහස් වන්නේ දෙවියන්වහන්සේ සහ උන්වහන්සේගේ කරුණාව දැනගැනීමෙන් ලැබෙන ප්‍රීතිය සහ ප්‍රීතියයි. එය ඇදහිලිවන්තයන් සඳහා ශක්තියේ උල්පතකි, විශේෂයෙන් දුෂ්කර හෝ දුෂ්කර කාලවලදී. ස්වාමින්වහන්සේගේ ප්‍රීතිය රඳා පවතින්නේ බාහිර තත්වයන් මත නොව, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන් තුළින් දෙන අභ්‍යන්තර සාමය සහ ධර්මිෂ්ඨකම මතයි.

**දෙවියන්වහන්සේගේ ප්‍රීතිය අත්විඳීම සුන්දර ලුහුබැඳීමකි! ඔබේ ජීවිතයේ ප්‍රීතිය වර්ධනය කර ගත හැකි ආකාරය පිළිබඳ අවබෝධයක් බෙදා ගැනීමට මට ඉඩ දෙන්න:**

- **දෙවියන් වහන්සේ සමඟ කාලය ගත කරන්න:**
  ප්‍රීතියේ අවසාන මූලාශ්‍රය දෙවියන් වහන්සේය. ඔහුගේ ස්වභාවයම ප්‍රීතිය විහිදුවයි, ඔහු සමඟ කාලය ගත කිරීමෙන් අපට එම ප්‍රීතිය ලබා ගැනීමට ඉඩ සලසයි. දෙවියන්වහන්සේගේ අභිමුඛයේ ඉමහත් ප්‍රීතියක් අත්කරගත් දාවිත් රජු මෙන්, අපටද යාච්ඤාවෙන් සහ උන්වහන්සේගේ වචනය කියවීමෙන් උන්වහන්සේ සමඟ ඇසුරු කරන විට ගැඹුරු ප්‍රීතියක් සහ ස්තුතියක් අත්විඳිය හැක. අප බයිබලය කියවන විට, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ප්‍රීතිය අපගේ හදවත්වලට වගුරුවන අතර, අප යාච්ඤා කරන විට, අපගේ බර උන්වහන්සේ වෙතට වත්කර, දිරිගැන්වීම් සහ ප්‍රීතිය ලබාගනිමින් ස්තුතිවන්තකම වර්ධනය කරන්න.

- **ඔබේ ජීවිතයේ බහුල ආශිර්වාද හඳුනා ගන්න:**
  සෑම ආත්මික ආශිර්වාදයකින්ම දෙවියන්වහන්සේ අපට ආශීර්වාදකර ඇති බව එපීස 1:3 අපට මතක් කර දෙයි. කෘතවේදීත්වය අපගේ අවධානය දුෂ්කරතා සහ අතෘප්තියෙන් දෙවියන් වහන්සේගේ යහපත්කම වෙත යොමු කරයි. අපි හිතාමතාම උන් වහන්සේට ප්‍රශංසා කරන විට සහ ස්තුතිවන්ත හදවතක් පවත්වා ගන්නා විට, ප්‍රීතිය ස්වභාවිකවම අනුගමනය කරයි.

මතක තබා ගන්න, සතුට අත්විඳීම සංකීර්ණ නොවේ. එය ආරම්භ වන්නේ මෙම සරල පියවර වලින්; දෙවියන් වහන්සේ සමඟ කාලය ගත කිරීම සහ කෘතඥතාව වර්ධනය කිරීම. උන්වහන්සේගේ ප්‍රීතිය ඔබේ හදවත පුරවාගනිත්වා!

එබැවින්, කිතුනුවකුගේ සැබෑ සතුට පවතින්නේ ඇදහිල්ලේ ගැඹුරු නැංගුරමක් තිබීම, දෙවියන් වහන්සේ පාලනය කරන බව දැන සිටීම සහ අපගේ උපරිමය සඳහා සියල්ල ක්‍රියා කිරීම තුළ ය.



Untitled-1.indd 6 7/26/2024 12:11:17 PM

සන්තෝෂය බොහෝ විට බාහිර සාධකවල බලපෑමට ලක්වන මානසික තත්වයක් වන අතර, ප්‍රීතිය මුල් බැස ඇත්තේ ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි අපගේ ඇදහිල්ල තුළය. ප්‍රීතිය තත්වයන් ඉක්මවා යන අතර ක්ෂණික හැඟීම් මත රඳා නොපවතී.ජේසුස් වහන්සේම වේදනාව හා ශෝකය අත්විඳ ඇතත්, ඔහුගේ ප්‍රීතිය පැමිණියේ දෙවියන් වහන්සේගේ සැලැස්ම සහ මනුෂ්‍යත්වය කෙරෙහි උන් වහන්සේගේ ප්‍රේමය කෙරෙහි ඇති නොසැලෙන විශ්වාසයෙනි.

■ **ආගම සහ සතුට:**

කිතුනුවන් වශයෙන්, දෙවියන් වහන්සේ අප සමඟ සිටින බවත් ඔහුගේ අරමුණු ඉටු වෙමින් පවතින බවත් අප දන්නා නිසා දුෂ්කර කාලවලදී පවා අපට ප්‍රීතිය අත්විඳිය හැකිය.අධ්‍යයනවලින් පෙනී යන්නේ නමස්කාර සේවාවන්ට සහභාගී වීම සහ ඇදහිලිවන්ත ප්‍රජාවක කොටසක් වීම වැනි ආගමික පිළිවෙත් යනාදිය සමස්ත යහපැවැත්මට සහ සතුටට දායක වන බවයි.කෙසේ වෙතත්, බොහෝ විට ආගම තුළින් සොයාගත හැකි සතුට ඉතා ගැඹුරු ය. ආගම ප්‍රතිලාභ ලබා දෙන අතර ඒ සතුට වඩාත් සංකීර්ණ සහ බහුවිධ වේ.සාරාංශයක් ලෙස, **ක්‍රිස්තියානි ධර්මය ජීවිතයේ අභියෝග මධ්‍යයේ පවා සැබෑ ප්‍රීතිය කරා ගෙන යන ගැඹුරු, නොසැලෙන ඇදහිල්ලක් දිරිමත් කරයි.** එය නිරන්තර සන්තෝෂය ගැන නොව අපගේ ජීවිත සඳහා දෙවියන් වහන්සේගේ ආදරය හා අරමුණ කෙරෙහි විශ්වාසය තැබීම වැදගත් ය.

සන්තෝෂය රඳා පවතින්නේ ස්වයං විනය මත ය. අපේ සතුටට ලොකුම බාධාව අපි මය. අපේම ස්වභාවය සමඟ සටන් කිරීමට වඩා සමාජය සමඟ සහ අන් අය සමඟ සටන් කිරීම පහසුය.

■ **සෝඩ බෝතලක් කැඩුවා වාගේ ලබන සතුට:**

ලොතරැයි ජයග්‍රාහකයෝ ඉතා අඩු මුදලක් වියදම් කොට අන් අයට වඩා කලාතුරකින් සතුටක් ලබති. ඒහෙත් ඔවුන් අලුතින් සොයාගත් ධනය උපයා නැත. තවද ඔවුහු බොහෝ විට ඔවුන්ගේ ජයග්‍රහණයෙන් පසු ඊට පෙර සිටි සතුටට වඩා අඩු සතුටක් ලබති. වසර ගණනාවක් දිවා රෑ නොබලා වැඩ කළ ව්‍යවසායකයා සාමාන්‍යයෙන් විශාල ධනයකට උරුමකම් කියන පුද්ගලයාට වඩා සතුටින් සිටින්නේ එබැවිනි. තලෙන්ත පිළිබඳ උපමා කථාවේ (මතෙ 25:14-30) මෙම කරුණ පැහැදිල ලෙස පෙන්වයි.

■ **පැමිණිලි කරන අය**

පැමිණිලි කිරීමෙන් අන් සියල්ලන්ගේම දවස විනාශ වෙනවා පමණක් නොව, පැමිණිලිකරුගේ දවසද විනාශ වේ. අපි මැසිවිලි නඟන තරමට, අප අසතුටට පත් වේ. වැඩිහිටියන් සතුටින් සිටින දරුවන් ඇති දැඩි කිරීමට සහ කෙඳිරි නොගාන්න කියා ඔවුන්ට උගන්වන්න අවශ්‍ය ය. නික්මයාම 16:1-9 ඉශ්රායෙල්වරු මෝසෙස් සහ ආරොන්ට විරුද්ධව මෙසේ කෙඳිරීම ගැන වාර්තා කරයි.

■ **සමීප මිතුරන් ඇති අය:**

සමීප මිතුරන් මිනිසුන්ගේ ජීවිත දිගු කරනවා පමණක් නොව එදිනෙදා ඔවුන් බොහෝ වැඩිහිටියන්ගේ සතුටට ඔවුන්ගේ දරුවන්ට වඩා වැඩි දායකත්වයක් සපයයි. ඔවුන්ගේ නව යොවුන් වියේ සිටම, දරුවන්ට සතුට ගෙන දීමට වඩා දෙමාපියන්ගේ අසතුට ඇති කිරීමට සැලකිය යුතු තරම් හැකියාවක් ඇත. සතුට සඳහා තම දරුවන් මත යැපෙන දෙමාපියන් තම දරුවන් සහ තමන් දුක්ඛිත තත්වයට පත් කිරීමට එක් හේතුවකි.ජීවිතයේ මූලික රීතියක් වන්නේ හැඟීම් ක්‍රියාවන් හැඩගස්වනවාට වඩා ක්‍රියාවෙන් හැඟීම් හැඩගස්වන බවයි. අප කරන දේ අපට දැනෙනවා. ආදරයෙන් කටයුතු කරන්න, එවිට ඔබට ආදරය දැනෙනු ඇත. සිතාමතාම සතුටින් ක්‍රියා කරන්න, එවිට ඔබට සතුටක් දැනෙනු ඇත, නැතහොත් ඔබ සතුටින් ක්‍රියා නොකරනවාට වඩා අවම වශයෙන් බොහෝ සතුටක් දැනෙනු ඇත. අපට සතුටක් දැනෙන්නේ නැති විට සතුටින් ක්‍රියා කිරීම 'අව්‍යාජී ය යන මතය අනුචණ ය.

■ **ඊර්ෂ්‍යාව නැති මිනිස්සු:**

කෙනෙකුට කොතරම් ස්වල්පයක් තිබුණත්, කොපමණ තිබුණත්, අන් අය සමග තමාගේ තත්වය සන්සන්දනය කිරිම සතුට විනාශ කරයි. වැඩි මුදලක් හෝ ලස්සන නිවසක් ඇති අයට සහ වඩා හොඳ දරුවන්, වඩා හොඳ පවුලක් හෝ හොඳ රැකියාවක් ඇතැයි අප සිතන අයට බොහෝ දෙනි ඊර්ෂ්‍යා කරති.

එහෙත් සත්‍යය නම් අප ඊර්ෂ්‍යා කරන කිසිවෙකුගේ වේදනාව සහ දුක් වේදනා අප කිසි විටෙකත් නොදන්නා බවයි. මාගේ ගුරුවරියක මට පරවසුවේ මට පැවසූ පරිදි, 'මම දන්නා එකම සන්තෝෂවත් මිනිසුන් මා හොඳින් නොදන්නා අයයි. පෙනුමට ඉතා සාර්ථක ජීවිත ගත කරන හොලිවුඩ් නළු නළියන්ගේ චරිත කථා කියවිමේ දී ඔවුන් කොතරම් සිත්තැවුල් වලින් පිරී සිටිත්ද?

ඊළඟ වතාවේ ඔබ වෙනත් පුද්ගලයෙකුගේ ජීවිතයට ඊර්ෂ්‍යා කරන විට, ඔවුන්ගේ අභ්‍යන්තර යක්ෂයන්, ඔවුන්ගේ ළමා කාලය, ජීවිතය සමඟ ඔවුන්ගේ සටන් ගැන ඔබ කිසිවක් නොදන්නා බව සිහියට ගන්න. මිතුරන් පවා බොහෝ විට තම මිතුරන්ගේ විවාහ ගැටලු ගැන දන්නේ අල්ප වශයෙනි. අසතුටින් සිටින අය සිතන්නේ ප්‍රීතිමත් ඉරියව්වෙන් එහා මෙහා යන අයට තමන්ට වඩා අඩු වේදනාවක් ඇති බවයි. ඔවුන්ගේ සිතුවිලි සෑම විටම පාහේ මේ සම්බන්ධයෙන් වැරදිය.

■ **ඉහළ ආත්ම අභිමානයක් නැති අය:**

අඩු ආත්ම අභිමානය සතුටට දායක නොවන අතර සමහර ආත්ම අභිමානය කෙනෙකුගේ සතුටට එක් කළ හැකිය. **නමුත් ඉහළ ආත්ම අභිමානය අසතුටට දායක වේ.**ඉහළ ආත්ම අභිමානයක් ඇති පුද්ගලයින්ට සමීප මිතුරන් සිටින්නේ කලාතුරකිනි. පළමුව, කිසිවෙකු පාහේ ඔවුන් සඳහා ප්‍රමාණවත් නොවේ. දෙවනුව, එවැනි අය සාමාන්‍යයෙන් දරාගත නොහැකි අතර, ඔවුන් sycophants ආකර්ෂණය කරන අතරම, ඔවුන් මිතුරන් පලවා හරිති. ඉලක්කය විය යුත්තේ ආත්ම අභිමානය නොව ආත්ම ගෞරවයයි.

■ **සුළු බලාපොරොත්තු ඇති අය :**

අපි වැඩි වැඩියෙන් බලාපොරොත්තු වන තරමට, අපි අඩු සතුටක් ලබනු ඇත. අප බලාපොරොත්තු වන තරමට, අපට ලැබෙන දේ සඳහා අප කෘතඥතාවය අඩු වේ. එමෙන්ම අකෘතඥකම යනු අසතුටින්ගේ මවයි.

■ **කෘතඥතාව:**

කෘතඥතාව වැඩි සතුටක් සමඟ දැඩිව හා ස්ථිරව සම්බන්ධ වේ. කෘතතාව මිනිසුන්ට වඩාත් ධනාත්මක චිත්තවේගයන් දැනීමට, හොඳ අත්දැකීම් රසවිඳීමට, ඔවුන්ගේ සෞඛ්‍යය වැඩි දියුණු කිරීමට, දුෂ්කරතා සමඟ කටයුතු කිරීමට සහ ශක්තිමත් සබඳතා ගොඩනඟා ගැනීමට උපකාර කරයි. කෘතඥතාව ප්‍රකාශ කිරීම ස්තුති කරන තැනැත්තාට සතුට ගෙන දෙන අතර නිෂේධාත්මක සිතුවිලි අඩු කරයි. කෘතඥතාවය සහ සතුට එකට සම්බන්ධය.

එසේම, උපයා නොගත් ද්‍රව්‍යමය ප්‍රතිලාභ ලැබීමට පුරුදු වන අය එම ප්‍රතිලාභ ලැබීමට පෙර සිටියාට වඩා අසතුටට පත්වීමට ඉඩ ඇත. ඔවුන් සතුව ඇති ඕනෑම දෙයක් උපයා ගත් අයට වඩා බොහෝ අඩු සතුටක් ලැබිම දක්නට ඇත. 1970-1977 කාලයේ ලංකා රජයෙන් හාල් සේරු (කිලෝ) දෙකක් සෑම පුරවැසියෙකුට රජයෙන් නොමිලේ දුන්නේය. ඒ කාලය තුළ රටේ ආර්ථිකය ඉතාමත් අඩු දියුණුවක් විය. ජනයා කතඥතාවයෙන් ඒවාගත්තා නොව තම අයිතවාසිකමක් ලෙස ගැනම් එයට හේතුවිය.

අපි හැමෝමෙ සතුටින් සිටිමට කැමැත්තෙමු. එහෙත් අපට ජීවය දුන් දෙවියන් වහන්සේට කෘතඥතාවය නැති තැන සතුටෙහි හරයක් නැත.

මහාචාර්ය පී.වී.පී. සෝමරත්න

(මෙතුමා කොළඹ විශ්ව විද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ මහාචාර්යවරයා වූ අතර දැනට කොළඹ දේව ධර්ම ශාස්ත්‍රාලයේ කිතුනු ඉතිහාසය හා පර්යේෂණ අංශය භාරව කටයුතු කරයි. එතුමාගේ දායකත්වයට ස්තුතියි)



Untitled-1.indd 7 7/26/2024 12:11:17 PM

# ආත්මික සඵලත්වය




ධර්මිෂ්ඨයා තාල වෘක්ෂය මෙන් සශ්‍රීක වන්නේය (ගීතාවලිය 92:12).

සශ්‍රීක වන්නේය නැතහොත් සඵල වන්නේය යන වචනය ගීතාවලිය 92:12-15 කොටසෙහි තෙවරක් සඳහන් වේ. තාල වෘක්ෂය ඇදහිලිවන්තයාගේ ජීවිතයට සමාන කළ හැකි හොඳම උදාහරණයකි. මේ ගැන අපි එකින් එක සොයා බලමු.

- කාන්තාරයේ තාල වෘක්ෂය මෙන් සශ්‍රීකවීම (12 පදය)
- ස්වාමින් වහන්සේගේ මිදුල් වල සඵලවීම (13 පදය)
- මහලු වයසේදී ඵල දෙමින් සශ්‍රීක වීම (15 පදය)

මෙලෙස සශ්‍රීක වන්නේ ධර්මිෂ්ඨයා ය. නැතහොත් ඇදහිලිවන්තයා ය. තම ජීවිත ගති පැවතුම් දේව වචනයට අනුව වර්ධනය කරගන්නා තාල වෘක්ෂය මෙන් සඵල වන්නේ ය. තාල වෘක්ෂයෙන් ඇදහිලිවන්තයාට ආත්මික සඵලත්වය උදෙසා උකහාගත හැකි ඉගැන්වීම් 6 ක් මෙයිදී සළකා බලමු.

## 01 ඇතුළතින් පිටතට (අභ්‍යන්තරයෙන් බාහිරට)




තාල වර්ගයේ ගස්වල වර්ධනය සිදුවන්නේ ඇතුලත සිට පිටත දක්වා වේ. ජීවනය ඇත්තේ ගස මධ්‍යයෙහි ය. පිටතින් තද ලීමය කොටස පිහිටයි. මෙය තාල වර්ගයට ආවේනික ලක්ෂණ වේ. රට ඉඳි, තල්, කිතුල් සහ පොල් උදාහරණ වශයෙන් දැක්විය හැකිය. මනුෂ්‍යයා ආත්මය, ප්‍රාණය, ශරීරය යනුවෙන් තුන් කොටසට බෙදේ. මෙයින් ඇදහිලිවන්තයාගේ අභන්තරයෙහි වූ ආත්මයෙහි ශුද්ධාත්මයාණෝ ජීවමානව වැඩ වසන්නාහ. සදාකාල ජීවනය ඇදහිලිවන්තයා සතුය. ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකිරීම් ඇතුලතින් නික්මෙහි. ලෞකික මනුෂ්‍යයා සියල්ල බාහිරයෙන් බලා සිටියි. එහෙත් ඇදහිලිවන්තයාට තම අභ්‍යන්තරයෙන් මහත් ශක්තියක් ඇත්තේ ය. ශුද්ධාත්මයාණෝ ඇදහිලිවන්තයාගේ ඇතුලත වාසය කරමින් ඔහු මෙහෙයවන සේක.

## 02. කාන්තාරයෙහි සශ්‍රීක බව

කාන්තාරය යන නම ඇසූ පමණින්ම වියලුණු, තද සූර්ය රශ්මියෙන් යුත්, පාට වැලි සහිත කර්කශ ප්‍රදේශයක් අපගේ සිහියට නැගේ. රට ඉඳි වලට අපි කවුරුත් කැමැත්තෙමු. එය ඉතා මිහිරි රසයෙන් යුක්තය. පළතුරු අතරින් වැඩිපුරම පැණිරස ඇත්තේ රට ඉඳි වල බව සැළකේ. රට ඉඳි සරුවට වැඩෙන්නේ කාන්තාර පරිසරයේ ය. නමුත් රට ඉඳි ගසේ වර්ධනයට හෝ ජීවිතය රැක ගැනීමට අවට පරිසරයෙන් ගසට කිසිම සහායෝගයක් නොලැබේ. ඒ වෙනුවට වැලි කුණාටු තද ඉරු රශ්මිය තද සුළං වැනි කටුක අත්දැකීම් වලට මුහුණ දීමට සිදුවේ. එහෙත් මෙම ගස වියළී නොයයි. සියල්ල විඳදරා ගනිමින් වර්ධනය වෙයි. අවසානයේ මිහිරි ඵලයක් පිටතට ගෙන එයි.

ඇදහිලිවන්තයා ජීවත් වන සමාජයද (ලෝකය) කාන්තාරයක් බඳුය. ඔහුගේ ඇදහිල්ල වර්ධනය කර ගැනීමට හෝ ආත්මික වර්ධනයට කිසිම සහයෝගයක් මේ ලෝකයෙන් නොලැබේ. ඇදහිලිවන්තයා කෙතරම් කරදර පීඩා සහිත ජීවිතයක් ගත කලත්




14 වන පිටුවට



Untitled-1.indd 8 7/26/2024 12:11:17 PM



# මගේ එක "Status"

සමාජ මාධ්‍ය කියන්නෙ අද අපිට නැතුවම බැරි දෙයක්. කාලෙන් කාලෙට හැමදේම වෙනස් වෙනව වගේ මේ සමාජ මාධ්‍ය භාවිතයත් වෙනස් වෙලා.

FB එකේ Post දාපු අපි දැන් Insta- story,FB-story,Whatsapp- Status වලට හුරු වෙලා. මේවා අතරිනුත් අපි වැඩිපුරම භාවිතා කරන්නෙ "whatsapp Status" එයට හේතුව තමයි විශේෂයෙන් "whatsapp Status" මගින් අපව දන්නා අය වෙත අපගේ updates ගෙන යෑමට හැකි වීමයි.

MESSAGES

**BIBLE**

" මනුෂ්‍යයන් විසින් ඔබේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේට ප්‍රශංසා කරන පිණිස ඔබේ ආලෝකය ඔවුන් ඉදිරියෙහි බබළාවා"

ඇත්තෙන්ම කිතුණුවන් මෙම නව්‍යත්වය සමග කණ්ඩායමක්, සමූහයක් වශයෙන් නව තාක්ෂණය හා මුසුවෙමින් නව තරුණ පරපුරට ඔබින ලෙස වෙනස් වෙමින් දෙවියන් වහන්සේව නමදීම සහ දේව ගෞරවය උදෙසා කරන්නාවූ ක්‍රියාකාරකම් අන් අය අතර බෙදා ගැනීමට හැකිවීම අපිට සතුටට කරුණකි.

එමගින් තරුණයෙක් වශයෙන් හුදෙකලා වී තමන් විසින් ගොඩනගා ගන්නා වූ ලෝකයක තනිවීම යන සංකල්පය වෙනුවට කණ්ඩායමක් සමග වර්ධනය වීම වැනි යහපත් සංකල්පයන්ට අනුබල දීම මෙහිදීම අපට දක්නට ලැබෙන ධනාත්මක කරුණකි.

කෙසේ වෙතත්, සමාජ මාධ්‍ය හරහා අපගේ ඇදහිල්ල ප්‍රදර්ශනය කිරීමට වඩා අපගේ අභ්‍යන්තර අධ්‍යාත්මික ජීවිතය වර්ධනය කිරීම වැදගත් බව අප හඳුනාගත යුතුය.

බයිබලය 1 සාමුවෙල් 16:7 හි අපට මතක් කර දෙන්නේ **"ස්වාමීන්වහන්සේ මනුෂ්‍යයා බලන්නාක්මෙන් නොබලනසේක; මනුෂ්‍ය තෙමේ පිටාතර පෙනීම බලන්නේය, නුමුත් ස්වාමීන්වහන්සේ සිත බලනසේකැයි කීසේක."** මෙම පදය අපගේ whatsapp Status වලට වඩා අපගේ අභ්‍යන්තර අධ්‍යාත්මික Status එකෙහි වැදගත්කම අවධාරණය කරයි.

අපි තරුණ වැඩසටහන් හෝ රැස්වීම්වලට සහභාගි වන විට, අපට ලැබෙන ආත්මික ආශීර්වාද ගැන අවධානය යොමු කරනවා වෙනුවට, අපි බොහෝ විට අපගේ දුරකථන පින්තූර සහ මතකයන්ගෙන් පුරවා ගනිමු. එවැනි වැඩසටහන් වලින් පසුව, අපගේ මූලික අවධානය යොමු විය යුත්තේ ඡායාරූප Status ලෙස, FB Story ලෙස පළ කිරීමට වඩා දෙවියන් වහන්සේ අපට දුන්නාවූ පණිවිඩයට අවදානය යොමු කිරීමයි.




12 වන පිටුවට



Untitled-1.indd 9
7/26/2024 12:11:18 PM




# ආසයි වෙන්නට මම - ජේසුගේ දරුවෙක් ....

**දුවේ පුතේ, ඉතිං කොහොමද ඔයාලට. හැම කෙනෙක්ම හොඳින් ඉන්නවා ඇති නේද?**

හරි එහෙනම්, ඉස්සරවෙලාම ඔයාලගෙන් පොඩි ප්‍රශ්නයක් අහන්නම්. ඒකට උත්තර දෙන්නකෝ. අද දවසට එක සැරයක් හරි ඔයා කැඩපතින් එහෙම නැත්නම් කණ්ණාඩියෙන් ඔයාගේ හැඩ බැලුවද?

"ආහ් මොකද නැත්තේ, අද ඉස්කෝලේ යන්න කලිනුත් මම කැඩපතින් මගේ මූණ බැලුවා, අද මම කොණ්ඩේ පීරුවේ කණ්නාඩියෙන් බලාගෙන, ඒ විතරක් නෙමෙයි කණ්නාඩියෙන් මම ඇඳපු ගවුමේ හැඩ බැලුවා" ඔයාට එහෙම හිතෙන්නත් ඇති නේද.

> *"වටිනා ඇඳුම් ආයිත්තම්, ආලේපන වගේ දේවල් අත්‍යවශ්‍ය වෙන්නේ නෑ. අපිට තිබෙන දෙයින් පිරිසිදුව, අලංකාරව ඉන්න අපිට පුළුවන්."*

සෑහෙන්න වෙලාවක් කැඩපත ළඟට වෙලා එහෙට මෙහෙට කැරකි කැරකි හැඩ බලන දුවලා පුතාලත් ඉන්නවා ඉතිං අපි අතරේ. දුවේ පුතේ, අපි හැමෝම වගේ කැඩපතක් /කණ්ණාඩියක් පාවිච්චි කරනවා. කොණ්ඩේ පීරද්දි, ඇඳුම් වල අඩුපාඩු හදාගන්න, පවුඩර් දාද්දි අපි කැඩපතක් ඉස්සරහට යනවා අනිවාර්යයෙන්ම. සමහරු තමන්ගේ පසුම්බියේ, අත් බෑගයේ පුංචි කැඩපතක් අරගෙනත් යනවා. ඒ තරම්ම තමන්ගේ බාහිර ස්වරූපය ගැන සැළකිලිමත් වෙනවා.



ඒ විදිහට කැඩපතක් භාවිතා කරන්නේ ඇයි? අපගේ බාහිර ස්වරූපය ගැන විමසා බලන්න. බාහිරින් පෙනෙන අඩුපාඩු මොනවද කියලා අපිටම දැකගන්න එතකොට අපිට පුළුවන් වන නිසයි.

හරි, අපි දැන් අපේ මාතෘකාවට එමුකෝ. දුවේ පුතේ, බාහිරින් ඉතාමත් අලංකාර විදිහට ඉන්න එක ගොඩාක් හොඳ දෙයක්. ලස්සනට කොණ්ඩේ පීරලා, මුහුණ හෝදලා, පිරිසිදු/ ගැලපෙන ඇඳුම් ඇඳලා, පවුඩර් ටිකක් එහෙම දාලා ඉන්නකොට ඔයාව තවත් ලස්සනට පේනවා. ඒකට අපිට වටිනා ඇඳුම් ආයිත්තම්, ආලේපන වගේ දේවල් අත්‍යවශ්‍ය වෙන්නේ නෑ. අපිට තිබෙන දෙයින් පිරිසිදුව, අලංකාරව ඉන්න අපිට පුළුවන්.

එහෙම ඉන්නකොට අපිත් සමග සිටින අනෙක් අයට අපිව ප්‍රියමනාප කෙනෙක් වෙනවා.

නාන්නේ මුහුණු හෝදන්නේ නැති, අපිරිසිදු, අපවිත්‍ර ඇඳුම් අඳින, කෙනෙක්ව ආශ්‍රය කරන්න කවුරුත් කැමති නෑ නේද? සමහරුන් නියපොතු කපන්නේ නෑ, නියපොතු ඇතුලේ කුණුපිරිලා. ඉස්කෝලෙදි ගුරුවරුන්ගෙන් බැනුම් අහනවා මේ වගේ දේවල් නිසා. කොණ්ඩේ පීරන්නේ නෑ, ගැට ගැහිලා. ඇඳුම් හෝදන්නේ නැතුව ආයේ ආයේ අඳිනවා. නාන්න කැමැතියි. සමහරුන්ගේ යට ඇඳුම් හරිම අපිරිසිදුයි. මේ වගේ වුණාම අපිට නොදැනීම අපේ ශරීරයෙන් පිට වෙන දහඩිය වගේ ස්‍රාවයන් නිසා ශරීරයෙන් අප්‍රසන්න ගන්ධයක් නිකුත් වෙනවා. එතකොට ඔයාව ඔයාගේ යාළුවෝ කොන් කරන්නත් ඉඩ තියෙනවා. කාවවත් කොන් කරන එක හොඳ දෙයක් නෙමෙයි.

"ඒත් ඔයාගේ වරදින් ඒ වගේ දේවල් වලට මුහුණ දෙන්න ඔයාට සිද්ධ වෙන්න පුළුවන්."

දුවේ පුතේ, සිරිත් මල්දම කියලා ලස්සන කාව්‍ය සංග්‍රහයක් තියෙනවා ඔයාලා අහලා තියෙනවද? අධ්‍යාපනය ලබන දරුවන් විදිහට ඉතිහාසයේ තියෙන මේ වගේ සාහිත්‍ය කෘති ගැන දැනන් ඉන්න එකත් වැදගත් දුවේ පුතේ. ඉතිං මේ සිරිත් මල්දමේ කවි අතර තියෙන මේ වගේ ලස්සන කවි පංති කිහිපයක් සඳහන් කරන්න කැමතියි.



කිලිටු රෙදි බැනියම් - ඇඳුම් නාඳිනු කිසියම්
පිරිසිදු නිසි ඇඳුම් - අඳින් හැම කල නුඹලට ඇත්නම්

දිග නියපොතු වැඩුණු - තිබුම හොඳ නෑ කප්පනු
දත්පෙළ කුණු බැඳුණු - පෙනෙයි කැත ලෙස හොඳින් සෝදනු

ඉතිං දුවේ පුතේ, ඔයා දිහා කෙනෙක් බැලුවාම, ඔයා ප්‍රිය උපදවන ස්වරූපයේ කෙනෙක් වීම ඉතා වැදගත්.

"කෙනෙක්ට අපිව මනින්න පුළුවන් පළවෙනි විදිහ තමයි අපේ බාහිර ස්වරූපය."



Untitled-1.indd 10 7/26/2024 12:11:20 PM

ඒ නිසා ඒක නිසි ලෙසින් පවත්වාගෙන යාම හුඟාක් වටිනවා. ඔයාලා හැමෝම ලස්සනයි. ලස්සන කියන්නේ එකිනෙකාට අනන්‍යය වුණු දෙයක්. ඒ නිසා "අනේ මට වඩා අරයා ලස්සනයි. එයාගේ හමේ පාට, එයාගේ උස මට නෑනේ" මේ වගේ කරදර වෙමින් තවත් කෙනෙක් එක්ක ඔයාව සංසන්දනය කරන්න උත්සාහ කරන්න එපා. ඔයාගේ ලස්සන ඔයාට ආවේනිකයි. ඒ වගේ තවත් කෙනෙක්ට පිහිටන්නේ නැහැ. ඒ නිසා ඔයා ඔයාව රැක ගන්න, පවත්වාගෙන යන්න උත්සාහ කරන්න. ඔයාගේ වටිනාකම ඉස්මතු වෙන ආකාරයෙන් කටයුතු කරන්න.

*"අපි කොච්චර බාහිරින් අලංකාර විදිහට හිටියත්, වටිනා ඇඳුම් ඇන්දත්, ඒ වෙනුවෙන් කොතරම් මුදල් වියදම් කළත්, අපේ අභ්‍යන්තරය අලංකාර නැත්නම් ජේසුස්වහන්සේ ඉදිරියේ අපිව ප්‍රතික්ෂේප වෙන්නට ඉඩ තියෙනවා."*



*"හොඳට මතක තියාගන්න. ඔයා වගේ දෙවියන්වහන්සේ මවලා තියෙන්නේ එක්කෙනයි. ඔයාගේ ස්වරූපය බොහෝම විශේෂයි. අවේණිකයි. ඔයා මේ ලෝකෙට උපදින්නත් කලින් දෙවියන්වහන්සේ ඔයාගේ ස්වරූපය තීරණය කරලා තියෙනවා. ඔයාව උන්වහන්සේ දැකලා තියෙනවා."*

ගීතාවලිය 139:15-16 මෙහෙම කියනවා.

'මාගේ ඇටකටු සැදෙන විට, මවු කුසෙහි මා වැඩෙන විට, රහසිගත ව මා තැනෙන විට මා එහි වූ බව ඔබ දැන සිටි සේක. මා බිහි වන්නට පෙර ඔබ මා දුටු සේක.......'

හරි ඉතිං මම මෙච්චර වෙලා කතා කළේ අපේ බාහිර ස්වරූපය ගැනනේ. බාහිර අලංකාරය වැදගත් වගේම නංගියේ මල්ලියේ ඔබේ ඇතුළත අලංකාරයත් හුඟාක් වැදගත්.

ඉතිං 'මොකද්ද ඒ ඇතුළත අලංකාරය කියලා කියන්නේ?' කෙනෙක් බාහිරින් ඔබව බලලා ඔබ ගැන දළ අදහසක් ගන්නවා.

ඊට පස්සේ ඔබව ආශ්‍රය කරද්දි ඔයා කොහොම කෙනෙක්ද? ඔබගේ සිතිවිලි, අදහස්, මොන වගේද කියලා තේරුම් ගන්නවා. ඒකට අපි කියනවා 'ආකල්ප' කියලා. ඔබගේ කතා ස්වරූපය, හැසිරීම, ක්‍රියාවන් මේ හැමදේටම ඔබේ 'ආකල්ප' වැදගත් වෙනවා. කණ්ණාඩියක් ඉස්සරහට ගියාට ඔයාට ඒ දේවල් දකින්න ලැබෙන්නේ නැහැ. ඉතිං ඔබේ බාහිර කොච්චර ලස්සන වුණත් වටිනා ඇඳුම් ඇන්දත්, ඔබේ ඇතුළාන්තය පිරිසිදු නැත්නම් ඔබව ආශ්‍රය කරන අය ඔබට දොස් කියාවි. ඔබව ප්‍රතික්ෂේප කරාවි. ඔබ නොසිතින ගැටලු වලට මුහුණ දෙන්නත් සිදු වෙන්න පුළුවන්. කෙනෙක්ගේ චරිතය ගොඩනගා ගන්නට ආකල්ප කියන දේ හුඟාක් වැදගත් වෙනවා.

ඔබ ඔබේ නිවසේ අය සමග ක්‍රියා කරන්නේ කොහොමද? පාසලේ යාලුවන්, අසල්වැසියන්, වැඩිහිටියන්, ගුරුවරුන් සමග ක්‍රියා කරන්නේ කොහොමද? කවුරු හරි ඔබට ගැහුවොත් ඔබේ ප්‍රතිචාරය මොන වගේද? කවුරු හරි ඔබට වරදක් කළොත් ඔබ මොකද කරන්නේ? ඔබ බෙදා හදා ගන්න කැමති කෙනෙක්ද? ඔබ අන් අයව අගය කරන්න කැමතියිද? ඔබ නිතරම අඬදබර කරන කෙනෙක්ද? ඔව් දුවේ පුතේ, මේ වගේ දේවල් වලින් ඔබේ ආකල්ප බාහිර අයට ප්‍රකාශ වෙනවා. ඒ වගේ අවස්ථා වල ඔබේ හැසිරීම, ක්‍රියා කිරීම, ඔබේ වචන වලින් ඔබේ අභ්‍යන්තරය ගැන පැහැදිලි ලෙස අනික් අයට දකින්නට අවස්ථාව ලැබෙනවා.

බයිබලයේ මෙන්න මේ වගේ ගුණාංග කිහිපයක් ගැන සඳහන් කරනවා.

***ප්‍රේමය, ප්‍රීතිය, සාමය, ඉවසීම, කරුණාව, යහපත්කම, විශ්වාසකම, මෘදුකම හා ආත්ම දමනය තමයි ඒ ගුණාංග. ඒ දේවල් වලට අපි ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල කියලා කියනවා. ශුද්ධ බයිබලයේ ගලාති පොතේ 5:22***
මේ ගැන සඳහන් වෙනවා.



ටිකක් කල්පනා කරලා බලන්න. මේ දේවල් ඔබ තුළ තියෙනවද? ඒ දේවල් ඔබ තුළ තිබෙනවා නම් ඔබ යහපත් ආකල්ප වලින් පොහොසත් දරුවෙක් විදිහට හඳුන්වන්න පුළුවන්. මේ ගුණාංග ඔබ තුළ නැතිනම්,

"මම කොහොම හරි මේ ගුණාංග මා තුළ ඇති කරගෙන යහපත් ආකල්ප වලින් පිරුණු ජේසුගේ දරුවෙක් වෙනවා"

කියලා අදම හිතට ගන්න. ඒ වෙනුවෙන් උත්සාහ කරන්න. දුවේ පුතේ, හොඳින් මතක තබා ගන්න. අපි කොච්චර බාහිරින් අලංකාර විදිහට හිටියත්, වටිනා ඇඳුම් ඇන්දත්, ඒ වෙනුවෙන් කොතරම් මුදල් වියදම් කළත්, අපේ අභ්‍යන්තරය අලංකාර නැත්නම් ජේසුස්වහන්සේ ඉදිරියේ අපිව ප්‍රතික්ෂේප වෙන්නට ඉඩ තියෙනවා. එසේම සමාජයේ ජීවත් වෙන අය විදිහට අන් අය සමග යහපත් සම්බන්ධතාවයක් ඇති, අන් අය ප්‍රිය කරන චරිතයක් වෙන්නට නම් බාහිර වගේම අභ්‍යන්තරයත් පිරිසිදුව තබා ගැනීම ඉතාම වැදගත්.



එසේ හොඳ ආකල්ප වලින් පිරුණු, ප්‍රියමනාප, දෙවියන්වහන්සේ කැමති ආකාරයේ දරුවෙක් වෙන්නට ඔබ සියලු දෙනාටම දෙවියන්වහන්සේ ආශීර්වාද කරන සේක්වා. ජේසු පිහිටයි.

හංසිනි නැන්දා
(බැප්ටිස් සභාව ගෝනවල)



Untitled-1.indd 11 7/26/2024 12:11:22 PM

08 වන පිටුවෙන් කළකිරීමට පත්නොවෙයි ඔහුගේ ආත්මික වැඩීම දුර්වල නොවේ. මෙම සශ්‍රීක බව ප්‍රධාන වන්නේ මුදල්වලින් හා මෙලොව වස්තු වලින් පොහොසත් වීම නොවේ. ආත්මික සශ්‍රීක ස්වභාවයයි. එනම් ඇතුළාන්තයේ සිදුවන්නාවූ සශ්‍රීකභාවයකි. අවසානයේ ඇදහිලිවන්තයා මේ ලෝකයට මිහිරි සේවයක් ඉටු කිරීම මගින් තමා ජීවත්වන සමාජයට ප්‍රයෝජනවත් වෙයි. දේව වචනය දැනගැන්මෙන්, යාච්ඤාවෙන්, සාක්ෂි දැරීමෙන්, සහභාගිකමෙන්, ආත්ම දිනාගැනීමෙන් හා බෙදාගැනීමෙන් මෙකී සශ්‍රීක බව ප්‍රකාශ වෙයි.

### 03. ඉහළින් එල




තාල වර්ගයේ වෘක්ෂයන්හී කොළ සහ එල ගසේ ඉහළින් පිහිටයි. කොළවල ගසට උවමනා ආහාර නිෂ්පාදනය වන්නේ සූර්යාගේ උපකාරයෙන් බව අපි දනිමු. මේ ආහාර ගමන් කරන්නේද ශාකයේ අභ්‍යන්තරයටයි.

"ඇදහිලිවන්තයාගේ ජීවිතය ස්වර්ගීය ස්ථානවල බව එපීස 2:6 හී සඳහන් වේ. (ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ස්වර්ගීයවූ ස්ථානවල උන්වහන්සේ සමඟ අප හිඳවූසේක.)"

දෙවියන් වහන්සේ සමග දිනපතා කිට්ටු ඇසුරක් පවත්වාගෙන යාම ඉතා අවශ්‍ය වේ. තාල වෘක්ෂය මෙන් අපි දවසින් දවස ස්වර්ගීය ජීවිතයට වඩ වඩා සමීප විය යුතුය. ගසෙහි කොළ එල සහිත කොටස ඔටුන්නක් පැළඳි හිසක් මෙන් ය. මේ හිස පොළොවට ඉතා ඉහළින් ය. ඇදහිලිවන්තයාගේ සිතද පොළොවේ ලෞකික තෘෂ්ණා වලින් ඈත්වී ස්වාමින් වහන්සේ වෙත නැඹුරු වීම දේව කැමැත්තයි. රට ඉඳි ඉතා මිහිරිතම පැණි රසයකින් යුක්ත බව අපි ඉහතින් ද කියෙව්වෙමු. එහෙත් මේ එල වලින් ප්‍රයෝජන ලබන්නේ පොළොවේ වැසියන් ය. එසේම ඇදහිලිවන්තයාගේ ජීවිතය ආත්මික එල වලින් අන් අයට ප්‍රයෝජනයක් වෙනවා ඇත. ගලාති 5:23 සිට මේ උතුම් එල ඇති ගුණාංග නවයක් ගැන සඳහන් වේ. ඉන් ප්‍රේමය ප්‍රධානය.

> "යොහන් බව්තීස්ත මෙයට හොඳ ආදර්ශයකි. සොල්දාදුවන්ට පවා කෙලින්ම ඔවුන්ගේ වැරදි පෙන්වා දීමට පසුබට නොවූ ඔහු වැරදි විවාහයක් ගැන රජෙකුට පවා ස්ථිරව කතා කළේය. මේ නිසා ඔහුට සිරබත් කෑමට ද ගෙල සිඳිනු ලැබීමට ලක්වීමට සිදුවිය."

### 04. සැඟවුනු දිය උල්පත්

ගීතාවලිය 87:7 හී ඇතුලෙහි දිය උල්පත් ගැන සඳහනක් ඇත. කාන්තාරය යනු වතුර ගැන සිතීමටත් අමාරු ස්ථානයක් වුවත් රට ඉඳි ඉතා සශ්‍රීක එල දෙයි. ඉතා ගැඹුරු තැන්වලින් වතුර රැස්කර ගැනීමට හැකි පුදුම ශක්තියක් මේවාට ඇත. ජලයෙන් අදහස් වන ආත්මික අර්ථය නම් දේව වචනයයි. අද ලෝකයේ ලෞකික පත-පොත බහුලයි. එහෙත් මිනිසාට විජයග්‍රාහී ජීවිතයකට එයින් ප්‍රයෝජනයක් නැත. තාල වර්ගයට අයිති නොවන විශාල ලෙසින් අතු පතර විහිදී යන සෑමතැන මුල් දුවන මහා ගස් පවා ග්‍රීෂ්ම කල වලදී වියලී ගිය අවස්ථා ගැන අප අසා ඇත. පසුගිය වර්ෂා කාලයේදී බොහෝ ස්ථාන වල ගස්කඩා වැටීම් ගැන අපට අසන්නට ලැබුනි. කාන්තාරයේ පවා එල දෙන තාල වෘක්ෂය ඇදහිලිවන්තයාගේ ජීවිතයට අපූර්වතම සංකේතයකි. සැඟවුනු දිය උල්පත් බයිබලයේ ඕනෑතරම් තිබේ. ඒවා පාදා දෙන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේය. එයින් නික්මෙන ජීවන ගංගාවල් ආත්මයට ඇතුලු වී පසුව අවට අයවත් පෝෂණය කරයි. දේව වචනය මත රැඳී සිටිමින් ශුද්ධාත්මයාණෝ කරණකොටගෙන එහි සැඟවුන දිය උල්පත් වලින් සශ්‍රීක වීමට අවස්ථාව ස්වාමින් වහන්සේ විසින් අපට ලබා දී ඇත.




### 05. ඇද නැති කම.

තාල වර්ගයේ ගස් (සුව පහසු පරිසරයක වැඩෙන පොල් ගස් හැරුණු විට) නයෙකු මෙන් ඇද වී වැඩෙන්නේ නැත. එය තනි කෙලින් සිටගත් ස්ථිර පෙනුමක් ඇති ගසකි.

එපීස 6:10 හී "ස්වාමින් වහන්සේ තුළද උන්වහන්සේගේ ශක්තියෙහි බලවත් කමෙහිද බලවත් වෙයල්ලා.

ඇදහිලිවන්තයාද ස්ථිර නොනැවෙන සිතක් ඇති කෙනෙක් විය යුතුය. වරද පෙන්වා දීමට ඔහු මැලි නොවේ. සත්‍යය කථා කිරීමට පසුබට නොවේ. තම වාසියට කටයුතු නොකරයි. මනුෂ්‍යයන් සතුටු කිරීමට දිව මුවහත් නොකරයි. අන් අයගේ නැති වැරදි දක්වා තම තත්වය උසස් කරගැනීමට මුසා බස් නොකියයි. හිතෝපදේශ 8:15 මෙසේය.

"දුෂ්ටයන්ගේ පූජාව ස්වාමින් වහන්සේට පිළිකුලක් ය. එහෙත් ඇද නැත්තන්ගේ යාච්ඤාවට උන්වහන්සේ ප්‍රසන්නය"

යොහන් බව්තීස්ත මෙයට හොඳ ආදර්ශයකි. සොල්දාදුවන්ට පවා කෙලින්ම ඔවුන්ගේ වැරදි පෙන්වා දීමට පසුබට නොවූ ඔහු වැරදි විවාහයක් ගැන රජෙකුට පවා ස්ථිරව කතා කළේය. මේ නිසා ඔහුට සිරබත් කෑමට ද ගෙල සිඳිනු ලැබීමට ලක්වීමට සිදුවිය. නමුත් අද මහ කණගාටුවට කරුණක් නම් ක්‍රිස්තියානි ලෝකයේ ඇතැම් ඊනියා අනාගතවක්තෘවරු පව්කාර ලෝකයට පැමිණෙන්නට තිබෙන විනිශ්චය ගැන කථා කිරීමට සූදානම් නැතිව මෘදු වචන කථා කිරීමට සොයති (යෙසායා 30:10-2, 2 තිමෝති 4:13).

### 06. සමබරතාවය.

මෙම ගස්වල සමබරතාවයක් දක්නට ඇත. දේව දරුවා ශුද්ධ ලියවිල්ලේ සෑම සත්‍යතාවයටම සමබර විය යුතුයි. එක බයිබල් සත්‍යයකට පමණක් තම අවධානය සීමා කිරීම වැරදියි. ශුද්ධ බයිබලයේ ඉගැන්වීම් වල පුදුමාකාර සත්‍යතාවේ සමබරකමක් ඇත. ඇදහිලිවන්තයා තමාගේ ආත්මික ජීවිතයේදී සභා ජීවිතයේදී හා පුද්ගලික ජීවිතයේ සෑම ක්ෂේත්‍රයකම සමබරතාවයක් තබා ගැනීමට ප්‍රවේසම් විය යුතුය. ගෙදර ජීවිතයත්, සභා ජීවිතයත්, සමබරව තබා ගැනීම අත්‍යවශ්‍යය. පිට වැස්මක් දමා ගන්නා ඇදහිලිවන්තයන්ද



Untitled-1.indd 13 7/26/2024 12:11:24 PM

නැත්තේම නොවේ. සහභාගිකමේ සබරතාවයද ඉතා වැදගත් ය. සැමදෙනා සමගම එක වගේ සහභාගිකම පැවැත්විය යුතුය. උගත්-නුගත් පෙහොසත්-දුප්පත් උස්-පහත් කුල ජාති කිසි භේදයක් සහභාගිකමට ඇතුළත් නොවේ.

ගීතාවලිය 90 සිට 92 පරිච්ඡේද ඇදහිලිවන්තයාගේ විජයග්‍රහණය පිළිබඳ විග්‍රහයක් කරති. අපි සළකා බැලූ ගීතාවලියේ 92 පරිච්ඡේදය ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත වේ. 1-7 පද වලින් දෙවියන් වහන්සේගේ යහපත්කමට ප්‍රශංසා කිරීමත් 8-15 පදවල දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨකමට ප්‍රශංසා කිරීමත් සිදුවේ. සශ්‍රීක ආත්මික සඵලත්වයක් උදෙසා ගීතාවලිය 90-92 පරිච්ඡේද ත්‍රිත්වය මේ සමග මෙනෙහි කිරීම යුතු බව අවධාරණය කරමින් තාල වෘක්ෂය මෙන් සශ්‍රීක ඇදහිලිවන්තයෙක් වීමට ස්වාමින් වහන්සේ තුළ ඇපකැප වෙමු.




| තාල වෘක්ෂය (Palm) | කිහිරි ගස (Ceder) |
|---|---|
| උතුරු අප්‍රිකාවේ සිට ඉන්දියාව දක්වා ප්‍රධාන වශයෙන් ඉඳි ගස් දක්නට ලැබේ. ගෘහ නිර්මාණයේදී කලා කෘතියක් වශයෙන් යොදාගත්හ (1 රාජා 6:29; 32, එසකියෙල් 40:31) දේව ප්‍රේමයේ, ගෞරවයේ හා කීර්තියේ සංකේතය විය. ගසේ විශාල අතු යොදා ගෙවල් ආවරණය කෙරුණි. පියස්ස, පැළැල්ල, වට්ටි, පෙට්ටි යනාදිය සඳහා මෙන් කඹ සහ ලණු තනාගැනීම පිණිස ද යොදා ගන්නා ලදී.<br><br>දෙබෝරා ජීවත් වූයේ තල්ගසක් යට ය (විනි 4:5). කැපූ රූප ගැන දක්වන ජෙරමියා දිවැසිවරයා පෙන්වන්නේ 'ඒවා තල් ගසක් මෙන් නටකුරු බවය (යෙර 10:5) ගෘහ නිර්මාණ කලාවේ අලංකාරය සඳහා තල් ගස් යොදා ගනු ලැබීය (1 රාජා 6:29, 32, 35, 7:36, 2 වංශාවලිය 3:5 සහ එසකි 40:16)<br><br>තල් ගස ඈත අතීතයේ සිටම සෙමිටික ජනයාගේ ජීවිතයේ වැදගත් තැනක් ගෙන ඇත. මිසරයේ පැරණි කාලයේ සිටම තල් වර්ගයේ ගස් සිතුනම් සහ සැරසිලි අතර වේ. හෙබ්‍රෙව්වරු ද සැරසිලි වශයෙන් තල් ගස යොදා ඇත (1 රාජා 6:29, 32, 35; 7:36; 2 වංශා 3:5) එය අලංකාර බවේ සංකේතයක් විය (ප්‍රේම 7:7)<br><br>ජුදෙව් කාසි වල මෙම ගසෙහි රූපය බහුලව භාවිත කර ඇත. ජුදෙව්වරුන්ගේ සිනගෝග වල ද මෙම රූපය ජනප්‍රිය වූයේ ය.<br><br>අතීතයේ සිටම ජෙරිකෝ නුවර ප්‍රසිද්ධ වූයේ 'ඉඳිගස්' නුවර කියා ය. තල් අතු සමාජයේ ඉහළම පංතිය සංකේත කරයි (යෙසායා 9:14, 19:15) කූඩාරම් මංගල්‍යයේදී තල් අතු භාවිත කෙරුනි (ලෙවී 23:40, නෙහෙ 8:15, 2 මකබි 10:7). යේසුස් වහන්සේ සමග ජෙරුසලමට ඇතුලු වූ පිරිස ද තල් අතු රැගෙන ගියහ (යොහන් 12:13). බැටළු පෝතකයාණන් ඉදිරියේ අසංඛ්‍ය ජන සංඛ්‍යාවක් තල් අතු රැගෙන සිටින බවට එළිදරව් 7:9 සඳහන් කරයි | පැරණි ඉශ්රායෙලයේ භාවිතයට ගත් වටිනා ලී වර්ගයකි. හෙබ්‍රෙව් අරශ්, උගරිතික අර්ස්, ග්‍රීක් කෙදෙස් යනුවෙන් මුල් භාෂාවල වචන වලින් හඳුන්වා ඇත.<br><br>ලෙබනනයේ කඳු වලින් ඉශ්රායෙලයට කිහිරි ලී ලැබුනේ ය. මෙම ගස් පලස්තීන ප්‍රදේශයේ බහුලව දක්නට ලැබුනි ( 1 රාජාවලිය 6:9-10:27). ඒවායේ තේජස් ලක්ෂණ, ශක්තිය (1 රාජා 4:33, යෙසා 35:2, 60:13, ආමොස් 2:9, 2 රාජා 14:9, ප්‍රේම 5:15)<br><br>දාවිත් සහ සලමොන් රජුන්ගේ කාලවල කිහිරි ලී විශාල ප්‍රමාණයක් භාවිතා කරන ලදී (2 සාමු 5:11, 7:2, 1 රාජා 5:1-7, 1 වංශා 14:1, 2 වංශා 2) මෙම ලී කඳන් ලෙබනනයේ සිට මුහුදට ගෙනැවිත් ඒවා විශාල පහුරු වශයෙන් එක්කොට බැඳ මුහුදේ පා කර ජොප්පා නුවර දක්වා ගෙන එන ලදී. දාවිත් රජු කිහිරි ලීයෙන් කළ මාලිග ාවක් තැනීමට තීර් ප්‍රදේශයෙන් ශිල්පීන් ගෙන්වා ගත්තේය (2 සාමු 5:11). සලමොන් රජු දේව මාලිගාවේ වැඩ කිරීම සඳහා කිහිරි ලබා ගත්තේ ය (1 වංශාවලිය 22:4).<br><br>කිහිරි ලීය ශක්තිමත් වූවා පමණක් නොව වඩා අලංකාර ලෙස පිරිමැදීමට සහ වර්ණ කිරීමට හැකි විය. කිහිරි තෙල් ඈත කාලයේ රෙදි සහ පදම් කළ හම් කල් තබා ගැනීමට ඉතා අගනා සුරක්ෂකයක් විය. චාරිත්‍රානුකූල පවිත්‍ර කිරීම සම්බන්ධයෙන් කිහිරි සඳහන් කරන්නේ ය.<br><br>කිහිරි ගස යන්න ශක්තියේ සංකේතය ලෙස භාවිත විය (ගීතා 29:5, 37:35, යෙසා 2:13, 9:10 සෙක 11:2).<br><br>රාජාණ්ඩු සමයේ කිහිරි ලීය යන වචනයෙන් බොහෝ අවස්ථාවල සංකේතවත් කළේ දීර්ඝායුෂ ය. |

නෙවිල් ප්‍රනාන්දු.
සහකාර සම්බන්ධීකාරක,
මාතර,
යෞවන කිතුමග
(ලිපි සැපයීමෙන් දුන් දායකත්වයට ස්තුතියි.)



Untitled-1.indd 14 7/26/2024 12:11:24 PM

# කිතුණු ඇදහිලි ප්‍රකාශණ




කිතුණු සභාව වසර (2000) ට වඩා පැරණි ඉතිහාසයක් දරයි. සභාව මුල් අවධියේ සිටම විවිධ අභියෝග යන්ට මුහුණ දුන්හ. ව්‍යාජ ඉගැන්වීම්, යෙදීම් හා වියවුල් කරන මිනිස් ඉගැන්වීම් සභාව තුළට ඇතුළුවී සභාව විනාශ කිරීමට විවිධ උපක්‍රම සාතන් හා ව්‍යාජ කණ්ඩායම් විසින් ක්‍රියාත්මක කරනු ලැබීය.

වර්තමානයේ ද සභාවට විරුද්ධව මෙවැනි උපක්‍රමික ඉගැන්වීම් හඳුන්වා දෙමින් සභාව නිවැරදි ගමන් මාර්ගයෙන් බැහැර කිරීමට උත්සාහ දරයි.

අද "දූතයා"පාඨකයා වෙත ගෙන ඒමට මා බලාපොරොත්තු වන්නේ අතීත සභාව මුහුණ දුන් එම ගැටළුවලට විවිධ ඇදහිලි ප්‍රකාශනයන් මගින් සභාව පිළිතුරු දුන් ආකාරයයි.

## 01) අපෝස්තලික ඇදහිලි ප්‍රකාශනය.

නිළ වශයෙන් ඇදහිල්ල (විශ්වාසය) සම්බන්ධයෙන් පිළිගන්නා ලද නියාමනයන් අඩංගු කෙටි ප්‍රකාශණයක් මෙයින් අදහස් කෙරේ. ක්‍රිස්තියානි ධර්මය පිළිබඳව සරල, සංක්ෂිප්ත, අවසර ලත්, විධිමත් ප්‍රකාශනයක් වන අතර එය "මම අදහමි" යන (credo) ලතින් වචනයෙන් ප්‍රකාශනය වී තිබේ.

සාමාන්‍ය කිතුණු ජනයාට කිතුණු දහමේ මූලධර්මයන් සිත් තුළට කාවැද්දීමට මාර්ගයක් ලෙස මේවා සකස් කරන ලද අතර, භාවිතය ජනප්‍රිය කෙරුණේ දුර්මතවාදීන් බහුල යුගවලය.

මුල්ම ඇදහිලි ක්‍රමයක් වන්නේ "අපෝස්තලිකවරුන්ගේ ඇදහිලි ක්‍රමයයි". එය ක්‍රි:ව 150 වර්ෂය දක්වා අතීතයට ගමන් කෙරේ. මෙය පළමු කිතුණු සභාවේ අපෝස්තලිකවරුන්ගේ ඉගැන්වීම් සංෂිප්තයකි. එය පසුව කිතුණු සංඝය විසින් අනුමත කරන ලද ප්‍රකාශනයක් ලෙස අතීතයේ සිට භාවිතා කර ඇති බව වාර්තාවේ. තවද ඔවුහු අපෝස්තලික වරුන්ගේ ඉගැන්වීම්මෙහි, ද සහභාගීකමෙහිද, අවසන් භෝජනය පැවැත්වීමෙහි ද, යාඥාවල ද ස්ථිර ලෙස පැවතුණ බව (ක්‍රියා 2:42) නව ගිවිසුමේ වාර්ථාවේ.

*"සාමාන්‍ය කිතුණු ජනයාට කිතුණු දහමේ මූලධර්මයන් සිත් තුළට කාවැද්දීමට මාර්ගයක් ලෙස මේවා සකස් කරන ලද අතර, භාවිතය ජනප්‍රිය කෙරුණේ දුර්මතවාදීන් බහුල යුගවලය. "*

විවිධ කිතුනු නිකායන් හා සභාවන් වර්තමානයෙහි පැවතුනද; සමස්තයක් ලෙස සියල්ලන් එක්සත්ව එකඟව විශ්වාස කරන කිතුණු පොදු විශ්වාසය හා ඉගැන්වීම් මෙම ඇදහිලි ප්‍රකාශන තුළ ගැබ්ව තිබීම ප්‍රීතියට කරුණකි.

### අපෝස්තලික ඇදහිලි ප්‍රකාශනය.

ස්වර්ගයෙහි ද පෘථිවියෙහිද මැවුම්කාර වූ සියලු බලය ඇති පිය වූ දෙවියන් අදහමි. උන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන් වූ අපේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අදහමි. උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් පිළිසිඳ මරියානම් කන්‍යාවගෙන් ඉපිද පොන්තියුස් පිලාත් යටතේ වද විඳ කුරුසියෙහි ඇනගසනු ලැබ මැරී තැන්පත් කරනු ලැබ ආත්ම නිවාසයට බැස තුන්වන දින මළවුන්ගෙන් නැගිට ස්වර්ගයට නැඟී සියලු බලැති පියවූ දෙවියන් වහන්සේගේ දකුණු භාගයෙහි වැඩහිඳින බවද ජීවත් වන්නන් හා මළවුන් විනිශ්චය කරන පිණිස එතැනින් එන බවද අදහමි. ශුද්ධාත්මයණන් වහන්සේ ද අදහමි ශුද්ධ වූ කතෝලික සභාව ද ශුද්ධවන්තයන්ගේ සහභාගිකම ද පාප සමාව ද ශරීරයාගේ නැවත නැගිටීමද සදාකාල ජීවනය ද අදහමි.



Untitled-1.indd 15 7/26/2024 12:11:25 PM

## 02) නයිසියානු ඇදහිලි ප්‍රකාශනය.

මෙම ඇදහිලි ප්‍රකාශනය ක්‍රිස්තු වර්ෂ 325 නයිසියානු නුවර පැවැත් වූ සම්මේලනයේදී සාධාර්මික පක්ෂය විසින් පිළිගත් ඇදහිලි ක්‍රමයයි.

ක්‍රිස්තු වර්ෂ 4වන සියවසයේ දී කිතුනු විශ්වාසයන් අතර ත්‍රිත්වය හා යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දේවත්වය පිළිබඳව පැන නැගුණු දුර්මත ඉගැන්වීම් මෙම ඇදහිලි ප්‍රකාශය බිහිවීමට හේතු විය. ජැකොබස් ආමීනියන් දේවධර්මිකයා හා ඔහුගේ ඉගැන්වීම් කිතුනු පොදු විශ්වාසයන්ට එරෙහිව ඉගැන්වීම් පවත්වමින් සභාව නොමග යැවීමට උත්සාහයක යෙදී තිබේ.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ යහපත් මිනිසෙකු හා සදාචාරවත් සිල්වත් පුද්ගලයකු ලෙසට උගන්වමින් ඔවුන් උන්වහන්සේගේ දේවත්වයට පහර ගසනු ලැබූහ. එහෙත් කිතුණු සභා නායකයන් එකතුව ඉතා ගැඹුරින් එනම් මුල් භාෂාවෙන් ලියැවුණු (ග්‍රීක) පිටපත් අධ්‍යයනය කිරීමෙන් යේසුස් වහන්සේ හා දෙවියන් වහන්සේ තැනැන්වහන්සේලා දෙදෙනෙකු නොව එකම තැනැන්වහන්සේ බව එක හෙළා තීන්දු කෙරිණි.

> "යේසුස් ක්‍රිස්තුස් වහන්සේ යහපත් මිනිසෙකු හා සදාචාරවත් සිල්වත් පුද්ගලයකු ලෙසට උගන්වමින් ඔවුන් උන්වහන්සේගේ දේවත්වයට පහර ගසනු ලැබූහ."

පියාණන් වහන්සේ වහන්සේ හා සමඟ යේසුස් වහන්සේ එකම භවත්වය, එකම පැවැත්ම හා එකම දෙවිඳුන් බවත් ඔවුන් වටහා ගත්හ. (Homoousious-එකම) මෙයට පිළිතුරු ලෙස ජැකොබස් ආමීනියන් ඇතුළු කණ්ඩායම මුල් සභාවෙන් පිටුවහල් කරන ලදී. වර්තමානයේ ද එවැනි දුර්මතධාරීන් විවිධ නම්වලින් කිතුණු ප්‍රජාව වෙතට පැමිණ මුලාකරමින් ඔවුන්ගේ එම දුර්මතයන් ඉගැන්වීමෙහි යෙදී සිටියි.

සත්‍ය ඉගැන්වීම් වෙත යෑම සඳහා සභා ඉතිහාසය හා මුල් යුගයේ ඉගැන්වීම් වෙත අප යා යුතුව තිබේ.

(මෙම ඇදහිලි ප්‍රකාශණයන්හි සඳහන් "කතෝලික" යන්නෙහි අර්ථය විශ්වීය කිතුණු සභාව යන්නයි.)

### නයිසියානු ඇදහිලි ප්‍රකාශනය.

ස්වර්ගයෙහි ද පෘථිවියෙහිද මැවුම්කාර වූ සියලු බලය ඇති පිය වූ දෙවියන් අදහමි. උන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන් වූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අදහමි. උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් පිළිසිඳ මරියානම් කන්‍යාවගෙන් ඉපිද පොන්තියුස් පිලාත් යටතේ වද විඳ කුරුසියෙහි ඇනගසනු ලැබ මැරී තැන්පත් කරනු ලැබ ආත්ම නිවාසයට බැස තුන්වන දින මළවුන්ගෙන් නැගිට ස්වර්ගයට නැගී සියලු බලැති පියවූ දෙවියන් වහන්සේගේ දකුණු භාගයෙහි වැඩහිඳින බවද ජීවත් වන්නන් හා මළවුන් විනිශ්චය කරන පිණිස එතැනින් එන බවද අදහමි. ශුද්ධාත්මයණන් වහන්සේ ද අදහමි ශුද්ධ වූ කතෝලික සභාව ද ශුද්ධවන්තයන්ගේ සහභාගිකම ද පාප සමාව ද ශරීරයාගේ නැවත නැගිටීමද සදාකාල ජීවනය ද අදහමි.




(ත්‍රිත්වය පැහැදලි කිරීම සඳහා)

## 03) ඇතනේසියානු ඇදහිලි ප්‍රකාශනය.

ක්‍රිස්තුවර්ෂ 380 වන විට ශුද්ධාත්මයාණන් වහන්සේ සම්බන්ධව දුර්මත පතුරුවමින් උන්වහන්සේගේ පුද්ගලිකත්වය හා දේවත්වයට පහර ගසමින් සභාව වියවුලට පත් කළ කණ්ඩායමක්, ඇති විය.මෙම දුර්මතයන්ට විරුද්ධව කිතුණු සභාව එකමුතුව ගැඹුරු අධ්‍යයනයක යෙදුනි. අනතුරුව ක්‍රිස්තු වර්ෂ 381 කොන්ස්ටන්තිනෝපල් නුවරදී ඇතිකර ගත් සාමූහික කිතුනු ප්‍රකාශනය "ඇතනේසියානු ඇදහිලි ප්‍රකාශනය"යි.

තවද ඇනතේසියස් තුමා ඇතුළු කණ්ඩායම විසින් ශුද්ධාත්මයාණන් වහන්සේ පියාණන් වහන්සේ හා එකම සාරය බවත් එකම පෞරුෂයක් ඇති දෙවිඳුන් බවටද එකහෙලා පිළිගත්හ.

### ඇතනේසියානු ඇදහිලි ප්‍රකාශනය.

- ගැලවෙන්නට කැමැති කා විසින් නමුත් සියල්ලට ප්‍රථම කොට කතෝලික ඇදහිල්ල තදින් අල්වා ගත යුතුය.
- (යමෙක් ඒ ඇදහිල්ල සම්පූර්ණව නිර්මලව රක්ෂා නොකළොත් ඔහු ඒකාන්තයෙන් සදාකාලයටම විනාශ වන්නේය)
- කතෝලික ඇදහිල්ල වනාහිමේය. එනම් කතාන් මිශ්‍ර කිරීමක්වත් ස්වභාවය බෙදීමක්වත් නොකොට,
- අප විසින් ත්‍රිත්වයෙහි එකම දෙවියන්ටද ඒකත්වයෙහි ත්‍රිත්වයාණන්ටද නමස්කාර කිරීමය.
- මක්නිසාද පියානෝ එකම කර්තා කෙනෙක. පුත්‍රයානෝ අන්කතා කෙනෙක, ශුද්ධාත්මයාණෝ තවත් කතා කෙනෙක .
- එහෙත් පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේද ශුද්ධාත්මයාණන්ගේ ද දේවත්වය එකම ය, තේජස එක සමානය, මහිමය එක ලෙස සදාකාලිකය.
- පියාණෝ යම් සේද පුත්‍රයාණෝ එසේ වන සේක; ශුද්ධාත්මයාණොත් එසේ වන සේක.
- පියාණෝ නොමවන ලදහ, පුත්‍රයාණෝද නොමවන ලදහ, ශුද්ධාත්මයාණෝද නොමවන ලදහ.
- පියාණෝ අනන්තය පුත්‍රයාණෝද අනන්තය ශුද්ධාත්මයාණෝද අනන්තය.


Untitled-1.indd 16 7/26/2024 12:11:25 PM

ඇතනේසියානු ඇදහිලි ප්‍රකාශනයෙන්.......

- පියාණෝ අනන්තය පුත්‍රයාණෝද අනන්තය ශුද්ධාත්මයාණෝද අනන්තය.
- එහෙත් පියාණෝ සදාකාලිකය පුත්‍රයානෝද සදාකාලිකය ශුද්ධාත්මයාණෝ ද සදාකාලිකය.
- එහෙත් සදාකාලික වූ තුන් දෙනෙක් නොව සදාකාලික වූ එක්කෙනෙක්මය.
- එමෙන්ම අනන්තවූ නොමවන ලද්දාවූ තුන්දෙනෙක් නොව; නොමවන ලද්දාවූ අනන්තවූ එක්කෙනෙක්මය.
- එසේම පියාණෝ සියලු බලයෙන් යුක්තය, පුත්‍රයාණෝ ද සියලු බලයෙන් යුක්තය; ශුද්ධාත්මයාණෝද බලයෙන් යුක්තය.
- එහෙත් සියලු බලයෙන් යුක්තවූ තුන්දෙනෙක් නොව සියලු බලයෙන් යුක්තවූ එක්කෙනෙක්මය.
- එසේම පියාණෝ දෙවියන් වහන්සේය; පුත්‍රයාණෝ දෙවියන් වහන්සේය; ශුද්ධාත්මයානෝද දෙවියන් වහන්සේය.
- එහෙත් දෙවිවරු තුන්දෙනෙක් නොව එකම දෙවියන් වහන්සේය.
- එසේම පියානෝ ස්වාමීන් වහන්සේය, පුත්‍රයානෝද ස්වාමීන් වහන්සේය; ශුද්ධාත්මයාණෝ ද ස්වාමීන් වහන්සේය.
- එහෙත් ස්වාමිවරු තුන්දෙනෙක් නොව; එකම ස්වාමීන් වහන්සේය.
- මක්නිසාද ඒ ඒ කර්තෘන් වෙන වෙනම දෙවියන් වහන්සේ ද ස්වාමීන් වහන්සේ ද කොට පිළිගන්ට ක්‍රිස්තියානි සත්‍යතාව විසින් අපට බලකරන්නාක් මෙන්ම,
- දෙවිවරුන් තුන් දෙනෙක් හෝ ස්වාමිවරුන් තුන්දෙනෙක් හෝ ඇතැයි කීම; කතෝලික ආගමින් අපට තහනම්ව තිබෙන්නේය.
- පියාණෝය කා විසින්වත් නොකරන ලදහ; නොමවන ලදහ; ජනිත නොකරන ලදහ.
- පුත්‍රයාණෝ පියාණන්ගෙන් පමණක් වන සේක; නොකරන ලදහ, නොමවන ලදහ, එහෙත් ජනිත කරන ලද හ.
- ශුද්ධාත්මයාණෝ පියාණන්ගෙන් ද, පුත්‍රයාණන්ගෙන් ද වන සේක; නොකරන ලදහ, නොමවන ලදහ, ජනිත නොකරන ලද; එහෙත් නික්මෙන සේක.
- මෙසේ පීතෘන් තුන් දෙනෙක් නොව, එකම පීතෘ කෙනෙකඃ පුත්‍රයන් තුන්දෙනෙක් නොව, එකම පුත්‍ර කෙනෙකඃ ශුද්ධාත්මයාණන් තුන්දෙනෙක් නොව එකම ශුද්ධාත්මයාණන් කෙනෙක.
- මේ ත්‍රිත්ත්වයෙහි කිසි කෙනෙක් පෙර පස නොවන සේකඃ කිසි කෙනෙක් කුඩා මහත් නොවන සේක.
- එහෙත් ඒ තුන් කර්තෘහුම එක ලෙස සදාකාලිකයඃ එක සමානය.
- මෙසේ සර්ව පරාක්‍රමයෙන්ම ඉහත කී ලෙසඃ ත්‍රිත්වයෙහි ඒකත්වයටද, ඒකත්වයෙහි ත්‍රිත්වයටද, නමස්කාර කළ යුතුය.
- එබැවින් ගැලවෙන්නට කැමති කාව විසින් නමුත් ත්‍රිත්වය ගැන මෙසේ කල්පනා කළ යුතුය.
- තවද සදාකාල ගැලවීම පිණිස; අපේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මිනිස් බැව් ගැන්ම විශ්වාස ලෙස ඇදහීමත් කළ යුතුය.
- හරිවූ ඒ ඇදහිල්ල නම්ඃ දෙවියන් වහන්සේගේ පුත්‍ර වූ අපේ ස්වාමී වූ ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවි ද මනුෂ්‍ය ද වන සේකැයි විශ්වාස කිරීම සහ ප්‍රකාශ කිරීමය.
- කෙසේ ද, උන්වහන්සේ පියාණන් වහන්සේගේ ස්වභාවය ඇතිව ලෝකයන් මැවීමට පළමුවෙන් ජනිත වූ, දෙවියන් වහන්සේය. මෑණියන්ගේ ස්වභාවය ඇතුව ලෝකයෙහි උපන් මනුෂ්‍යයාය.
- උන්වහන්සේ සම්පූර්ණ දෙවියන් වහන්සේයඃ ඥානවන්ත වූ ආත්මයෙක් හා මනුෂ්‍ය ශරීරයක් ඇති සේක් සම්පූර්ණ මනුෂ්‍යයාය.
- දේවත්වයෙන් පියාණන්ට සමානය; මනුෂ්‍යත්වයෙන් පියාණන්ට සුළුය.
- උන්වහන්සේ දෙවිද මනුෂ්‍යද වන නමුත්ඃ දෙදෙනෙක් නොව එකම ක්‍රිස්තුස් වහන්සේය.
- එක්කෙනෙක්මය; කෙසේද දේවත්වය ශරීර භාවයට පෙරළීමෙන් නොව මනුෂ්‍යත්වය දේවත්වයට ගැනීමයඃ
- ස්වභාවය මිශ්‍රකිරීමෙන් නොවඃ කර්තෘභාවයේ ඒකත්වයෙන් සියලු ආකාරයෙන්ම එක්කෙනෙක්මය.
- ඥානවන්ත ආත්මය හා ශරීරය ද එක් මනුෂ්‍යයකු වෙන්නාක් මෙන්මඃ දෙවියෝ ද මනුෂ්‍යයාද එකම ක්‍රිස්තුස් වහන්සේය.
- උන්වහන්සේ අපේ ගැලවීම පිණිස වධවිඳ ආත්ම නිවාසයට බැස තුන්වන දින මළවුන්ගෙන් නැවත නැගිටුණු සේක.
- උන්වහන්සේ ස්වර්ගයට නැගී, සියලු බල ඇති දෙවි වූ පියාණන්ගේ දකුණු භාගයෙහි වැඩහිඳින සේකඃ උන්වහන්සේ ජීවත්වන්නන්ද මළවුන්ද විනිශ්චය පිණිස එතනින් එන සේක.
- උන්වහන්සේගේ ඊමෙහිදී සියලු මනුෂ්‍යයෝ තම තමන්ගේ ශරීර සහිතව නැගිටඃ තම තමන්ගේ ක්‍රියා ගැන ගනන් දෙන්නාහුය.
- එකල යහපත්කම් කළාහු සදාකාල ජීවනයටදඃ අයහපත්කම් කළාහු සදාකාල ගින්නටද යන්නෝය.

( කතෝලික ඇදහිල්ලනම් මෙය යමෙක් මේ ඇදහිල්ල අවංක ලෙස ස්ථිර ලෙසද නොඇදහුයේ නම් ගැලවෙන්ට නොහැකි වන්නේය.)

පියාණන්ටද, පුත්‍රයාණන්ටද, ශුද්ධාත්මයාණන්ටද ප්‍රශංසාවේවා.

- *මේ ත්‍රිත්ත්වයෙහි කිසි කෙනෙක් පෙර පස නොවන සේකඃ කිසි කෙනෙක් කුඩා මහත් නොවන සේක...*

18 වන පිටුවට »»»



Untitled-1.indd 17 7/26/2024 12:11:25 PM

17 වන පිටුවෙන්

## කිතුණු ඇදහිලි ප්‍රකාශණ......

ප්‍රිය මිතුර, කිතුණු සභාව හා එහි ඉගැන්වීම් ආරක්ෂිතව තබා ගනිමින් මතු පරම්පරාව වෙත සත්‍යය ඉගැන්වීම් පවත්වාගෙන යෑම අපගේ යුතුකමයි.
මේ සඳහා සභා පියවරුන් බොහෝ වෑයමක යෙදෙමින් මුල් පිටපත් ගැඹුරින් අධ්‍යයනය කරමින් එය අප වෙත ඉදිරිපත් කොට තිබේ.

නිතර මුලාවට පත් විය හැකි අසරණ බැටළුවන් වැනි සැදැහැවතුන් ආරක්ෂා කර ගැනීම අපගේ ප්‍රධාන අරමුණ විය යුතුය. අවසාන කාලයේ සභාව වෙත බැටලුහම් පැළඳ ගත් වෘකයන් පැමිණ කිතුනුවන් මුලා කරන කාලය දැනටමත් පැමිණ තිබේ. ඔබ වියවුලක පැටලී සිටින්නේ නම් සියල්ල නිවැරදිව විමසා බලා සත්‍ය ඉගැන්වීම් වෙතට පැමිණෙන ලෙස ආරාධනා කරමු. පාවුල් තුමා තම ශ්‍රාවක තිමෝති පාලකතුමාට ලියූ වැකියකින් මෙය නිමකිරීමට කැමැත්තෙමි.

*"බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථවූ විශ්වාසවූ මනුෂ්‍යයන්ට භාරදෙන්න".*

2 තිමෝති 2:2

ගෞරවනීය එස්.ඊ. ෆේබර් දේවගැති තුමා.

## සඵලත්වයේ රහස

නොයන්න මන්ත්‍රණය අනුව මිසදිටුවන්ගේ
නොහැසිරෙන්නෙ මාර්ගය පසදිටු
නොසිටින්න ආසනයෙහි නින්දා කරන
මෙනෙහි කරන්න දේව ව්‍යවස්ථාව
දිවා රැයෙහි....
සපල වෙයි සියල්ලම ඔහුගේ
දන්නා සේක සමිඳුන් දැහැමියන්ගේ මග
මිසදුටුවන් විනිශ්චයට පත්වේ සමිඳුන්ගේ...
සමාන වෙයි ඔවුන් විසිර යන බොල්මෙන්
විනාශවේ මාර්ගය ඔවුන්ගේ
සියල්ල සඵල වේ දමිටුවන්ගේ...

(ගීතාවලිය 01)





Untitled-1.indd 18 7/26/2024 12:11:30 PM

# සභා පුවත් >>>>

## රෙපරමාදු සන්ධානය -නෙදර්ලන්තය

2024 ජනවාරි 30 සිට පෙබරවාරි 03 දක්වා ජගත් රෙපරමාදු සැසිවාරය සඳහා සහභාගි වීමට ගෞරවනීය ස්ටැන්ලි නෙල්සන් දේවගැති තුමා හා ගෞරවනීය එස් ඊ ෆේබර් දේවගැති තුමා නෙදර්ලන්තය බලා ගියහ.

එම සැසිවාරයේදී සභාව මුහුණපාන වර්තමාන ගැටලු හා විවිධ මාතෘකා සාකච්ඡාවට භාජනය විය. තවද විවිධ සමාජ සේවා සංවිධාන (Verre Naasten- Distant Neighbhour) සමඟින්ද සාකච්ඡා පවත්වා තිබේ..

## 2024 නව සභා නායකත්වය

රෙපරමාදු සභාව 2024 වර්ෂය සඳහා නව නායකත්ව සැසිවාරයේ වාර්ෂික රැස්වීම මාර්තුමස 8 වන දින පැවැත්විය. එහිදී පහත සඳහන් තනතුරු සඳහා පත්කෙරින.

- ලක්මාල් විජේරත්න සභාපාලකතුමා- ගරු සභාපති
- පෙප්වාල් රික්සන් සභාපාලකතුමා - ගරු උපසභාපති (සේවාවන්)
- ස්ටීව් ශුබර්ට් සහෝදරතුමා- ගරු උපසභාපති (පරිපාලන)
- ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු සහෝදර තුමා - ගරු ලේකම්
- ලියනගේ අභයවික්‍රම සහෝදරතුමා - ගරු උපලේකම්
- ඇලෙක්ස් ඩක්වර්ත් සහෝදරතුමා- ගරු භාණ්ඩාගාරිකතුමා
- මාලන් ජෑන්ස් සහෝදරතුමා- පොත් තබන්නා
- සුනිල් ගුණසේකර සභාපාලකතුමා - ධර්මදූත (සේවා-සම්බන්ධීකාරක)
- චමින්ද රත්නායක සභාපාලකතුමා - උපස්තායක (සේවා-සම්බන්ධීකාරක)
- ගෞ. චාර්ල්ස් ජෑන්ස් දේවගැති තුමා - ඉගැන්වීම් හා පුහුණුකිරීම් (සේවා-සම්බන්ධීකාරක)

## කාන්තා සංසදය



2024/05/27 වන දින බම්බලපිටිය දේවස්ථානයේදී පද්මා එබනේසර් සහෝදරිය හා සමග පැවතී සුහද හමුව



කාන්තා සංසදය විසින් අප්‍රේල් මස 20 වන දින දෙහිවල හා ආදුරුප්පුවීදිය දේවස්ථානයන් හී පැවැත්වූ නිරාහාර යාච්ඤාවට සහභාගීවූවන්

## වැල්ලවත්ත

වැල්ලවත්ත සභාවට අලුතින් උපස්ථායකවරුන් ලෙස රාමපතිලගම් රුත්‍රතිලගම් හා සුදර්ශණ් කෲස් පත්කරනු ලැබීය.



## බම්බලපිටිය







2024 අප්‍රේල් මස 23 වන දින බම්බලපිටිය දේවස්ථානයේ දී පැවැත් වූ අවුරුදු උත්සවය

2024 මාර්තු මස 29 වන මහ සිකුරාදා දින බම්බලපිටිය දේවස්ථානයේදී පැවැත්වූ එක්සත් දේව මෙහෙයේදී බෞතීස්මය හා ඇදහිල්ල ප්‍රකාශ කරනු ලැබූවන්













2024 අප්‍රේල් මස 27 වන දින බම්බලපිටිය දේවස්ථානයේදී පැවැත් වූ "පරණ ගිවිසුම කියවීම" ළමා වැඩසටහන

## දෙහිවල



දෙහිවල සභාව මගින් සංවිධානය කර පවත්වනු ලැබූ නමස්කාර වැඩසටහන.



දෙහිවල සභාවට ලක්සිරි ගීතාල් (වැඩිහිටි තුමා) සිදත් නෝනිස් (උපස්ථායක තුමා) පත්කරණුලැබීය.ඔවුන් උදෙසා යාච්ඥා කරන්න.




## ■ විශේෂ බයිබල් අධ්‍යනයක්....

ඊලඟ කලාපයේ සිට ආමෝස් පොත ඇසුරින් පල කිරීමට බලාපොරොත්තු වෙමු.

-කතෘ

*"යුක්තිය ගලා බසින දිය දහරක් මෙන්ද ධර්මිෂ්ඨකම නොසිඳී ගලන ගඟක් මෙන් ද පවතීවා."*

*(ආමොස් 5:24)*